# 2026.02.10 දින පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ප්‍රාදේශීය සභා ගරු සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ප්‍රාදේශීය සභා ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සඳනා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඔගේ මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් පේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

## රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග චම්පික අලහකෝන් මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා

**<u>ආගම සිහි කිරීම.</u>**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 පෙබරවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු උපසභාපති ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## <u>06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .</u>

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

2026.01.06 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා විසින් ගෙන එන ආ ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

2015.01.16 දින පළ කරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සභික දීමනාව ගෙවීම සම්බන්ධව කාරක සභා හා මහා සභා රැස්වීම් සඳහා සහභාගී නොවන්නේනම් ඒ සඳහා නිවාඩු අනුමත කර ගත යුතු බවත්,කාරක සභා අවස්ථා 03 ක් සඳහා නොදන්වා නොපැමිනීම මත කමිටු සාමාජිකත්වය අහෝසි වන බවත් මේ දක්වා පැවති කමිටු වලට සාමාජික පැමිණීම දුර්වල වන අතර නමුත් කිසිදු දැනුම් දීමකින් තොරව කමිටු සඳහා සහභාගි නොවන අයගේ නිවාඩු මහා සභාවේදී අනුමත කරලා තියනවා අපි.ඒ නිසා කමිටුවලට එන්නෙ නැත්තම් ඔබතුමාලා දැනුම්දීමක් කරන්න කමිටුවලට සහභාගි වෙන්නෙ නැ කියලා .

ඊළඟට පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට විශේෂ අවස්ථාවක් හිමිවෙනවා.ඒ අවස්ථාව තමයි ප්‍රාදේශීය සභා අතරින් පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව පළවෙනි ශ්‍රේණියේ ප්‍රාදේශීය සභාවක් බවට පත්වුනා. ඒක සතුටින් ඔබතුමාලාට දැනුම් දෙනවා.ඒ නිසා ඒ වෙනුවෙන්ම විශේෂ ආදායම් උත්පාදන මාර්ග උපදවන ව්‍යාපෘති 03 කට යෝජනා ඉදිරිපත් කරන්න කියලා පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අපට දන්වා තියනවා. ඒ සඳහා අපි අදාල තාක්ෂණික නිලධාරීන් සමඟ සාකාච්ඡා කරලා යෝජනා මේ වන විට සකස් කරමින් තියනවා.

මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් ඉල්ලා අස්වෙන බවට ඉල්ලා අස්වීම් ලිපි ඉදිරිපත් කරලා තියෙනවා. ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් ඉල්ලා අස්වෙන බව දැනුම් දිලා තියෙනවා. ඊළඟට ගරු මන්ත්‍රීනී ආර්. එම්. නිලන්ති විජේසිංහ

මහත්මිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් ඉල්ලා අස්වෙන බව දැනුම් දිලා තියෙනවා. ගරු මන්ත්‍රීනී බී.එම්. ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් ඉල්ලා අස්වෙන බව දැනුම් දිලා තියෙනවා.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## 1.නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මන්ත්‍රීවරු කිහිප දෙනෙක් නිවාඩු ඉල්ලලා තියනවා. ගරු නිශ්ශංක රම්‍ය කුමාර මන්ත්‍රීතුමා, මා හට 2026.02.10 දින පැවැත්වීමට නියමිත සභා වාරය සඳහා පුද්ගලික අවශ්‍යතාවයක් මත විදේශ ගත වන බැවින් ඒ සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඊළඟට ගරු රංජිත් උපාලි අපේ මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා. මනෝකුමාර එදිරිසිංහ මන්ත්‍රීතුමා, තරංග චම්පික අලහකෝන් මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා. මේ නිවාඩු අනුමත කරලා දෙන්න.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, අද දින නිවාඩු ඉල්ලලා ඇති ගරු මන්ත්‍රීවරුන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.නිශ්ශංක රම්‍ය කුමාර මහතා වෙත ගරු මන්ත්‍රී ආර්.එච් රංජිත් උපාලි මහතා වෙත සහ ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා හා ගරු මන්ත්‍රී ඒ.පී. තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**II.2026.01.14 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.01.14 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා,ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රීනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, 2026.01.14 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිතුමියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි.එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.01.14 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා,ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රීනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික**

**අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III.2026.01.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.01.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමනි, 2026.01.22 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිවරුන් හා ගරු මන්ත්‍රීතුමියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>**ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.01.22 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**IV.2026.01.22 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.01.22 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)**</u>

2026.01.22 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>**ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.01.22 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය,**

**ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**V.2026.01.22 වන දින පැවති ටෙන්ඩර් කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

2026.01.22 වන දින පැවති ටෙන්ඩර් කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 වන දින පැවති ටෙන්ඩර් කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

**<u>ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.01.22 වන දින පැවති ටෙන්ඩර් කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පීරිස් මහතා ගරු මන්ත්‍රිනි බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම් චාන්දනී දීපිකා රත්නායක මහත්මිය, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මගෙ නිවස වෙත පෙත්සමක් එවලා තියෙනවා. සභාපතිතුමා අමතා සහ මට කොපියක් දාලා. මම ඉදිරිපත් කරනවා සභාවට මේ පෙත්සම.මහජන පෙත්සමයි.සභාපතිතුමා, පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව, හෙට්ටිපොල. අනවසර ඉදිකිරීමක් සම්බන්ධවයි. පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් බල ප්‍රදේශය වන විජය උදාගම මංසන්ධියේ පොළ පිහිටා ඇති ස්ථානයේ ටකරන් ගසා ඉදිකර ඇති වෙළඳ කුටිය සම්බන්ධව ඔබතුමන්ගේ ආයතනයේ නිසි නිලධාරියා විසින් ස්ථාන පරීක්ෂාවට ලක්කලද තවම ඒ සම්බන්ධව නීත්‍යානුකූල පියවර නොගන්නේ, කඩ හිමියා ප්‍රදේශයේ මන්ත්‍රිතුමියගේ ආවතේවකරු වශයෙන් වැඩ කරන නිසාද, එම මන්ත්‍රිතුමිය ජනතාව ඉදිරියේ සහ සභාවේ විපක්ෂව පෙනී සිටිමින් මාලිමාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරමින් ඔබතුමන්ට සහාය දක්වන නිසාද, එසේත් නොමැති නම් ජනාධිපතිවරයා පවසන පරිදි නීතියේ රේඛාවට ඉහළින් එම කඩ හිමියා සිටින නිසාද, එසේත් නොමැති නම් ආයතනය තුළ තවමත් පරණ බලවේග ක්‍රියාත්මක වන බැවින්ද කියා අප දැන ගැනීමට කැමැත්තෙමු. තවද මෙම ස්ථානයේ බදු මුදල් ගෙවා පවත්වා ගෙන යන පහසුකම්වලින් අඩු වෙළඳ සංකීර්ණය පිලිබඳව ඔබතුමන් සභාපති වී එම ස්ථානයේදී පවත්වන්නට යෙදුනු ප්‍රථම රැළියේදී ප්‍රදේශයේ මන්ත්‍රිවරයා සහ ඔබතුමන් දුන් පොරොන්දු ඉටු වන තුරු අප යහපත් සිතින් බලා සිටිනෙමු.මෙයට නීතියේ රේඛාවට සැමදා පහලින් සිටින පුරවැසියන්. මම සභාගතකරනවා සභාපතිතුමනි මේ පෙත්සම

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා.ඔය පිලිබඳව මම දැනුවත් වුනෙත් ඊයෙ.ඔය කඩය විවෘත කරලා තියෙනවා කියලා. ඊයෙ හවස මට දැනුම්දුන්නෙ මන්ත්‍රීවරියවත්, සභාවේ නිලධාරීන්වත් නෙවෙයි තවත් පුරවැසියෙක්.මම මේ වෙන කොටත් අදාල නිලධාරීන් යවලා තියෙනවා මේ කඩේ ඉවත් කරන්න කියලා.ඒ කඩේ ඉවත් කරන්න ඕන.මොකද සභාවට බලයක් තියෙනවා සහ සභාවට හොරෙන් කිසිවක් කරන්න බෑ.බලහත්කාරකම්, චණ්ඩිකම්,දේශපාලන බලය පාවිච්චි කරලා කරන වැඩ හොරෙන් කරන්න බෑ. ඒ නිසා ඒ සඳහා අදාල හරි දේ ඉටු කරන්න කියලා දැනුම් දීලා තියෙනවා.

## (ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

විශේෂ යෝජනා කිහිපයක් තියෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න.මා විසින් ඉදිරිපත් කරනවා අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මීළගට .මා විසින් ඉදිරිපත් කරනවා අවධානම් තත්වයේ ඇති පොල්ගස් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති අවදානම් තත්වයේ ඇති පොල්ගස් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

**(ඉ) I.<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව</u>**

යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මන්ඩලයෙන් සහ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ගෙන් අවසරයි. බණ්ඩාරකොස්වත්ත කොට්ඨාශයේ යායේගෙදර වසමෙහි “නවතෙ” කුඹුරුයාය මැදින් දිවෙන ආපදාවට ලක්වූ මාර්ගය ඇතුළු අනෙකුත් මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි,පසුගිය වර්ෂයේ එකලොස්වෙනි මාසේ ආපදාවට ලක්වුන මාර්ග වෙනුවෙන් විශාල මුදල් සංඛ්‍යාවක් ලැබිලා තිබුනා.ඉතාමත් සංතෝෂ වුනා මං. පඩුවස්නුවරට ලොකු සංවර්ධන ව්‍යාපෘතියක් වෙන නිසා.ඉතින් මං දන්නවා අපේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව තුල පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරු ඉන්නවා. පක්ෂව 21 දෙනෙක් ඉන්නවා. විපක්ෂව 17 දෙනෙක් ඉන්නවා කියලා අපිට තේරුනා.ඒ විපක්ෂයෙන් කියලා මන්ත්‍රිවරු දෙන්නයි එදා මුදල් කමිටුවට ආවෙ. අනිත් අය ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රිවරු මුදල් කමිටුවට ඉන්න.ඒත් මං හරිම සද්භාවයෙන් පඩුවස්නුවර ආසනේට ප්‍රතිපාදන වෙන්වෙලා මේකට සහයෝගය දෙන්න, මුදල් කමිටුවේ මෙය අනුමත කරලා දෙන්න පැමිනියා.පැමිනිලා එම ලේඛණ පරීක්ෂා කරද්දි සභාපතිතුමනි, මගෙ බණ්ඩාරකොස්වත්තෙ වසම් 4 න්ම එක වසමක ඒ කියන්නෙ බණ්ඩාරකොස්වත්තෙ ආණ්ඩු පක්ෂෙ මන්ත්‍රිතුමා නියෝජනය කරන ගමේ පාරවල් 4 ක් පමණයි එතන සඳහන් වෙලා තිබුනෙ. ඉතින් ඇත්තටම මං එතනදි ප්‍රශ්න කලා ආපදාවට ලක් වුනේ විශාල වශයෙන් යායෙ ගෙදර වසම.යායෙ ගෙදර වසම ඇතුළු වසම් 4 ම ආපාදාවට ලක් වුනා.විශේෂයෙන්ම යායෙගෙදර. මම කිව්ව මේ පාරවල් පමණක් නෙමේ බණ්ඩාරකොස්වත්තෙ අනිත් පාරවලුත් මේකට ඇතුලත් කරන්න ඕන.ඒ වගේම පඩුවස්නුවර ආසනෙත් කොට්ඨාශ 3,4 ක පාරවල් විතරයි ඒ වෙලාවෙ ඇතුලත් කරලා තිබුනෙ. ලේකම්තුමිය,TO මහත්තයා, සභාපතිතුමා ඇතුළු සියළුදෙනා ප්‍රකාශ කර සිටියා එදින රාත්‍රි 12.00 වන විට අදාල කල පාරවල් විතරයි මන්ත්‍රීතුමිය මේකට ඇතුලත් කරලා තියෙන්නෙ.ඔබේ කොට්ඨාශෙ ආපදාවට ලක් වුන පාරවලුත් මේකට ඇතුලත් කරලා අපි මේ වැඩේ කරමු. අනේ මං හරිම සද්භාවයෙන් සභාපතිතුමාටත් කිව්වා අපි හොඳ වැඩක් කරානම් සභාපතිතුමා කකුලෙන් අදින්නෙ නෑ.අපි වැරැද්දක් විතරයි පෙන්නලා දෙන්නෙ.හොඳ හැමදේටම සහයෝගය දෙනවා කියලා. සභාපතිතුමාට මතක ඇති සභාපතිතුමා ඒ වෙලාවෙ කියපු වචනෙත් ඔබතුමාට හොඳට මතක ඇති.අපි දන්නවා අත්දැකීමෙන් බොරළු පාරක් හදන්න යන වෙලාව, හදන පිලිවෙල, ඒ හින්දා මං එදා ඉඳන්ම ඒකට ක්‍රියාත්මක වුනා.ඒ හින්දා මං හොඳ බොරළු තියෙන තැන් හෙව්වා.කොහොමද මේක කරන්නෙ කියලා මං සැලසුම් කරා.බොරළුපාරක් සංවර්ධනය කරද්දි මූලිකව කරන්න තියෙන දේවල් තියෙනවා. පළමුවෙන්ම TO මහත්තයා ඇවිල්ලා පාර නිර්දේශ කරනවා. ආවෙ නැති හින්දා සතියක් දෙකක් බලලා TO මහත්තයට නිතරම කතා කරනවා අනේ මගෙ මේ යන්න බැරි පාරවල් ටික හදලා දෙන්න. TO මහත්තයා එන්නකො කියලා. TO මහත්තයත් බැරිම තැන 3, 4 පාරක් කථා කරාට පස්සෙ හිටපු මන්ත්‍රිතුමා ගම්වල ඉන්න ආණ්ඩුපක්ෂෙ ක්‍රියාකාරි අයගෙ නම්බර් දෙක තුනක් දුන්නා. ඔයාගෙ යායෙගෙදර වසමටත් එහෙම අය බලලා මං පාරවල් නිර්දේශ කලා කිව්වා. මං කිව්වා කමක් නෑ. කරනවනම් කව්රු හරි කමක් නෑ. මම අර පාර, මේ පාර නම් කෙරුවා.ඒවත් ඇතුලත් කරන්න කියලා.ඇත්තටම හරි කණගාටුයි සභාපතිතුමා ආපදාවට ලක් වුන මේ නවතෙ පාර කියන එක ප්‍රධාන පාර මැදින් කැඩිලා ගිය පාරක්.අපි ප්‍රදේශවාසීන් අහල පහල අය එකතු වෙලා, බොරළු ටිකක් වත්තකින් කපලා දාලා තමයි තාවකාලිකව ඒක හදා ගත්තෙ.ඒක පැති බැම්මක් දාලා, කුඹුරුයායක් මැදින් යන පාරක් ගෙවල් තියෙනවා.බොහොම සැලකිලිමත්ව කරන්න තියෙන පාරක්.ඒ කිසි දෙයක් නැතිව ආපදාවට ලක් නොවුනු පාරවල් කීපයක්, බොරළු අතුරලා එහෙන් මෙහෙන් වැඩ නිම කරලා තියෙනවා.ඒ පාරවලුත් විශාල බොරළු කැට දෙපැත්තට එකතු වෙලා ජනතාව බොහොම අසීරු තත්වයකට දැන් පත්වෙලා තියෙනවා.ඉතින් අපි බොරළු පාර කපද්දි මං ඉස්සරලාම කියපු විදිහට TO මහත්තයා ඇවිල්ලා නිර්දේශ කරන්න ඕන. පාරේ දිග කොහොමද කියලා බලන්න ඕන.ඒකට අවශ්‍ය බොරළු ප්‍රමාණය ඔහු තීරණය කරන්නෙ.මුලින්ම අපි බොරළු ටික ෆයිල් කරනවා.ෆයිල් කරාට පස්සෙත් ඔහු ඇවිල්ලා බලලා තීරණය කරාට පස්සෙ තමයි අතුරලා, තලලා ඒ විදිහට කරන්නෙ.එහෙම වුනේම නෑ. කොහෙන් හරි බොරළු ගෙනාවා. හලාගෙන හලාගෙන ගියා.සභාවක්නෙ මේ කරන්නෙ. නීත්‍යානුකූලව කරන්න ඕනිනෙ.මනුස්සයන්ගෙන් දෝෂාරෝපණය විතරයි පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට දැන් තියෙන්නෙ.ඉතින් ගම්වල නියෝජිතයො ගම් වල වැඩ කරනවා තමා ඔබතුමාලගෙ.ඒ වුනාට වගකිම් දරන්න අපි 38 දෙනෙක්

ඉන්නවා.ඒ 38 දෙනාටම මේ බලය පැවරුවනම් මන්ත්‍රිවරු කීපදෙනෙකුට පමණක් නෙමේ මේ පඩුවස්නුවර ආසනේ 38 දෙනාටම මේ බලය පවරන්න ඕන.එහෙම වුනා නම් බෙදාගෙන හරි ක්‍රමානුකූලව මේක කරනවා.අර මන්ත්‍රිතුමා දුන්නා නම් ගම්වල නියෝජිතයන්ගෙ නම්බර් ඒ අයට කියලා කරවා ගත්තෙත් නෑ.අපිට කරන්න දුන්නෙත් නෑ.මට මතක් වෙන්නෙ අර ඉස්සර අපි ඉගන ගත්තෙ පිදුරු ගොඩේ ඉන්න බූලා වගේ තමයි මේ වැඩේ.අපිට කරන්න දුන්නෙත් නෑ ඒ අය කෙරුවෙත් නෑ.ඉතින් ඒ හින්දා එදා ඉඳන්ම කියන්නෙ 74,000 ක් ඇප්ලිකේෂන් දාලා තියෙද්දි බොහොම වගකීම් ඇතිව මේ 38 දෙනෙක් තේරිලා ඉන්නෙ. ඔවුන්ට මේ වගකීම් පවරන්න. ගමේ ඉන්න ඒ නියෝජිතයින්ට එයාලගෙ පෞද්ගලික පාරක් හදා ගන්න තියන වුවමනාව එතන කොට්ඨාශයක වගකීම දරන්න එයාලට වුවමනාවක් නෑ.ඒකයි මං පුන පුනා කියන්නෙ.මේ අයට වගකීම් දෙන්න ඒ වගේම තමයි මෙච්චර රු.17,635,000.00 ක ප්‍රතිපාදන අපිට ආවා බොරළුවලට.එහෙම තියෙද්දිත් අපේ යාය ගෙදර වසමෙ පාරකට බොරළු අතුරන්න රුපියල් දෙතුන්දාහ එකතු කරලා තියෙනවා.ඇයි මේ බොරළුවලට මෙච්චර ප්‍රතිපාදන ඇවිල්ලත් මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කලේ. රුපියල් දෙතුන්දාහ ඇයි එකතු කරේ. එහෙම කරන්න නම් ඒ ප්‍රතිපාදන ආපු එකෙන් අපිට වැඩක් නැනෙ.අපි ශ්‍රමදාන මට්ටමින් කරගන්නවනෙ.හැමතැනම දැන් ගල් කැට බොරළු කැට එකතු වෙලා තියෙනවා.මනුස්සයන්ට යන්න බැරිව පීඩාවට පත්වෙලා තියෙනවා. ප්‍රතිපාදන ආපහු යනව කියලා ඉක්මනට වැඩ කරානෙ.ආපදාවට ඇත්තටම ලක් වූ පාරවල් වලට මොකද වෙන්නෙ.මේවා හදන්න ඕන නේද?ඉතින් ඒ හින්දා මම නැවතත් කියන්නෙ මේ යෝජනාව යටතේ නවතේ කුඹුරුයාය මැද පාර විශේෂ අවධානයක් යොමු කරලා ඉදි කරන්න ඕන.ඊට අමතරව යාය ගෙදර වසම ඇතුලත වගේම බණ්ඩාරකොස්වත්තෙ එතුමා නම් කරලා ගියාට වෙලගෙදර ගම මැද පාරවල් ටික බොරළු අතුරලා නෑ. වගකීමක් ගන්න බැරි හින්දා එතුමත් අයින්වෙලා ගියා.එහෙම තියෙද්දිත් වගකීම් ගන්න කෙනාටවත් මේක කරන්න දෙන්න ඕනිනෙ.ඒ හින්දා පක්ෂ පාට බලන්න එපා.මෙතන මන්ත්‍රිවරු 38 දෙනෙක් ඉන්නවා. 38 දෙනාටම වගකීම් පවරන්න.පවරල මේක හරිහැටි කරන විදිහ සැලසුම් කරන්න.ඉතින් ඒ හින්දා මගේ කණගාටුව ප්‍රකාශ කරනව මෙච්චර ප්‍රතිපාදන ඇවිල්ලා තියෙද්දි බොරළුවලින් පාරවල් සංවර්ධනය කරද්දි මේ තරම් අක්‍රමිකතා සිදු වීම ගැනත් මං කණගාටු වෙනවා. ඉදිරියේදිත් මේ වගේ දේවල් සිද්ද වෙන්න බෑ. මේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ. පඩුවස්නුවර පුරවරේ ජනතාවට මේ හානිය සිද්ධ වෙන්නෙ. විනිවිද භාවයකින් හරි දැක්මකින් යුතුව කාටත් සාධාරණව මේ වැඩ කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>

මන්ත්‍රිතුමිය කණගාටුයි.එකක් තමයි ගංවතුර හානි නිසා දෙසැම්බර් 31 ට කලින් මාර්ග සංවර්ධනය කරන්න කියලා අපට දැනුම් දුන්නා. සති දෙකයි තිබුනෙ. රු.17,635,000.00 ක් සභාවට ලැබුනා.එතකොට අපිට මාර්ගෝපදේශයක් ලැබුනා මේ මාර්ග කඩිනමින් සකස් කරන්න ගංවතුර තත්වය නිසා. ඒ මාර්ගෝපදේශවලට අනුව තමයි අපි මාර්ග හැදුවෙ. එතකොට තාක්ෂණ නිලධාරී අදාල කටයුතු කරලා තියෙනවා. අපි මාර්ග 256 ක් යවලා තියෙනවා යෝජනා කරලා පලාත් පාලන දෙපාර්තමේන්තුවට.ඒ මාර්ග 256 න් මාර්ග 107 ක් හදලා තියෙනවා.අවසන් කරපු නැති මාර්ග විසිගණනක් තියෙනවා අවසන් කරගන්න බැරි වුන. මොකද මාර්ග 107 ක් සතියක් ඇතුලත වැඩ නිම කරගන්න උත්සාහ කරා. රු.17,635,000.00 ට.ඔබතුමිය ඇහුවනෙ මෙච්චර සල්ලි ඇවිල්ලත් රුපියල් දෙතුන් දාහ එකතු කරේ ඇයි කියලා. අපි නම් කොහෙවත් දෙතුන්දාහ එකතු කලේ නෑ.ජනතාව මේ පාරවල් හැදුවෙ ශ්‍රමදාන මට්ටමින් ඒගොල්ලො එකතු වෙලා මහන්සි වෙලා. අපි බලාපොරොත්තු වෙනවා සභාවට ඉදිරිපත් කරන්න රු.17,635,000.00 යේ වටිනාකම දැන් කීයද කියලා.ඒ මාර්ග සම්පූර්ණ හදලා ඉවර වුනාට පස්සෙ ඒකෙ මුළු වටිනාකම කෝටි 5 පණිනවා. දැන් මාර්ග වල වටිනාකම. ඒ නිසා ඔබතුමියලා වගේ අයට මේවා හිතෙන්න ඕන.මොකද ඉතිහාසගත පුරුදු තියෙනවනෙ. ඒව අපිට ආදේශ කරන්න උත්සාහ කරනවා. අපි ඒවට උත්තර දෙන්නෙ වැඩ වලින්. ඒ නිසා අපි කලබල වෙන්නෙ නෑ. අපි වැඩ වලින් උත්තර දෙනවා. පළවෙනි ශ්‍රේණියේ සභාවක් බවට පත් වුනේ වැඩ වලින් තමයි.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය විසින් ඉදිරිපත් කල බණ්ඩාරකොස්වත්ත කොට්ඨාශයේ යායේගෙදර වසමෙහි "නවතෙ" කුඹුරුයාය මැදින් දිවෙන ආපදාවට**

**ලක්වූ මාර්ගය ඇතුළු අනෙකුත් මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**II.<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). II දරණ යෝජනාව</u>**
මා විසින් ඉදිරිපත් කරනවා.
හෙට්ටිපොල බහුකාර්ය ගොඩනැගිල්ලේ පිහිටි G-01, G -02, G -03,F-03 දරණ කඩ කාමර සඳහා 2026.04.01 දින සිට වසර 03 ක් සඳහා නව තක්සේරු කුලිය අය කර ගැනිමත්, F-02, F -01, S -01,S-02, S-03 දරණ කඩ කාමර සඳහා 2026.04.01 දින සිට නව තක්සේරු කුලිය අය කර ගැනිමත් සුදුසු බව යෝජනා කරනවා. මේවට තක්සේරු දෙපාර්තමේන්තුවෙ තක්සේරු ලැබිලා තියෙනවා.
කඩ කාමර අංක G-01 (141) රු. 52,500.00
කඩ කාමර අංක G-02 (141/2) රු.124,500.00
කඩ කාමර අංක G-03 (141/3) රු. 102,500.00
කඩ කාමර අංක F-01(141/1/1) රු. 27,000.00
කඩ කාමර අංක F-02 (141/1/2) රු. 37,000.00
කඩ කාමර අංක F-03 (141/1/3) රු. 40,000.00
කඩ කාමර අංක S-01(141/2/1) රු. 18,000.00
කඩ කාමර අංක S-02 (141/2/2) රු. 24,500.00
කඩ කාමර අංකS-03 (141/2/3) රු. 27,000.00
අදාල තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ලබා දීලා තියෙනවා 2026.04.01 දින සිට අවුරුදු 3 ක් සඳහා මේ තක්සේරු කුලිය අය කිරීමට අනුමත කරලා දෙන්න.
<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>
ගරු සභාවෙන් අවසරයි. සභාපතිතුමා විසින් ගෙන ආ. යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව හෙට්ටිපොල බහුකාර්ය ගොඩනැගිල්ලේ පිහිටි G-01, G -02, G -03,F-03 දරණ කඩ කාමර සඳහා 2026.04.01 දින සිට වසර 03 ක් සඳහා ගිවිසුම් ගත වීමටත් නව තක්සේරු කුලිය අය කර ගැනිමත්, F-02, F -01, S -01,S-02, S-03 දරණ කඩ කාමර සඳහා 2026.04.01 දින සිට නව තක්සේරු කුලිය අය කර ගැනිමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**III.<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය විසින් කරනු ලබන අංක 6.(ඉ). III දරණ යෝජනාව</u>**
යෝජනාව ඉදිරිපත් කරන්න.
<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>
ගරු මන්ත්‍රිතුමාගෙන් අවසරයි, ගරු මන්ත්‍රිතුමාලා ඒ වගේම ලේකම්තුමිය ප්‍රමුඛකාර්ය මණ්ඩලයෙන් අවසරයි. මගේ යෝජනාව තමයි.2025 නොවැම්බර් මස පැවති ගංවතුර තත්වය මත සෝදා පාලුවට පත් ග්‍රාමීය මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විශේෂයෙන් ගමට පිවිසීමට සහ නිතර ගමන් කරනු ලබන මාර්ග සඳහා විශේෂ අවදානය යොමු කර ගැනීම සඳහා මං ඒ යෝජනාව ඉදිරිපත් කරනවා.
<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.
<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>
සැමගෙන්ම අවසරයි.විශේෂයෙන්ම මම 2025 වර්ෂයේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව පළවෙන ශ්‍රේණියේ ප්‍රාදේශීය සභාවක් බවට නම් කිරීම පිලිබඳව මගේ සතුට සහ ඒ සඳහා ප්‍රශංසාව පළ කරනවා.ඇත්තටම ඒක හරි සතුටුදායක තත්වයක්. විශේෂයෙන්ම හිටපු අපේ නිලධාරී ලේකම් නිශ්ශංක මහත්මා සිහිපත් කළ යුතු වෙනවා.සභාව පිහිටෙව්වෙ 2025.06.13 ඒ වෙද්දි මාස 6 ක කාලයක් ගෙවිලා අවසන්.දැන් අනුමත කරන අනුමත වෙන හැම එකකම අපි 38 දෙනෙක් ඉන්නවා. සභාපතිතුමත් එක්ක.ඉතින් ඒ හින්දා ඒ දායකත්වය අපි හැමදෙනාටම තියෙනවා. විශේෂයෙන්ම මගෙ සතුට ප්‍රකාශ කර සිටිනවා මොකද ඒ කාලය තුල

කොමසාරිස් පාලනය යටතේ තිබුන කාලය තුල මේ සභාව තුල විශාල වැඩ කොටසක් කරා.ඒ නිසා තමයි අපි මේ සභා ගර්භයේ ඉන්නෙ.ඒ නිසා ඒ පිළිබඳව ප්‍රශංසාව හිටපු සියළුම නිලධාරීන්ට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න මා කැමතියි.විශේෂයෙන්ම දේශපාලන පක්ෂ මොනවා වුනත් දේශපාලන අත ගැසීම් වලින් තොරව නිලධාරීන් කටයුතු කිරීමේදී ඒක අපි දැක්කා.මං හිතනවා ඒ සියල්ලම ඒ ශ්‍රේණියේ සභාවක් වෙන්න පිටුවහල් වෙන්න ඇති.ඒ ගැන මං කියන්නෙ එච්චරයි. ඊටපස්සෙ මගෙ යෝජනාව තමා දෙසැම්බර් මාසෙ අපි නොහිතපු විදිහට අපි මේ ගැන කථා කරා. ඒ කාළගුණ තත්වය පිලිබඳ මං කථා කරන්නෙ නෑ. ඒකෙ ප්‍රතිපලයක් හැටියට ලංකාව පුරාම වෙච්ච ඒ හානියත් එක්කම පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ග්‍රාම සේවක වසම් 103 අතරින් මං හිතනවා ලොකු හානිදායක තත්වයන් වුන පාරවල් බොහෝ ගානක් තිබුනා. ඒකෙන් අර කිව්ව විදිහට විමධ්‍යගත, සභා අරමුදලක් නොවන රු.17,635,000.00 ක් පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට මාර්ග සංවර්ධනයට ලැබුනා.එතෙනදි ඒ ලැබුන ප්‍රතිපාදන යටතේ අර කියපු විදිහට හදිසියේ අනුමත කර ගත්ත පාරවල්කීපයක් මේ සඳහා නම් කරා. විශේෂයෙන්ම කිව්වොත් රු 12 ට, 1ට, 2 ට පාරවල් මැන්නෙ. අපි පදිංචි උන ගම්මාන වල ඒ විදිහට තමයි මැනුම් කටයුතු කරලා මේ විදිහට යොමු කරලා තිබුනෙ.ඇත්තටම කාර්මික නිලධාරින් ගොනුගත කරලා තිබුන ගොනු වල තිබුන පාරවල් විශාල ප්‍රමාණයක්. ඒ පාරවල් වල ලේඛණ අපි ළඟ තියෙනවා.ඒ පාරවල් වල දුර ප්‍රමාණ සහ වෙන්වන ඇස්තමේන්තු මුදල නම් කරලා තිබුනා. එතකොට ඊට අමතරව ගිය සැරේ මුදල් කමිටුව වෙලාවෙ අනුමත වෙච්ච වැඩ අවසන් කරා කියන පාරවල් 107 ක ලේඛණයක් මෙතන තියනවා. මම කියන්න හදන්නෙ මට කොට්ටාශයක් නෑ. මම ලැයිස්තු මන්ත්‍රිවරියක් නිසා මට මුළු පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේම පාරවල් ගැන කථා කරන්න පුළුවන්.විශේෂයෙන් මම පදිංචි කොට්ඨාශෙ මුණමල්දෙණිය කොට්ඨාශෙ පාරවල් කීපයක් තියෙනවා විශේෂයෙන්ම ගම්වලට පිවිසෙන්න තියෙන පාරවල්. එතකොට ටැකැව ගමට පිවිසෙන්න තියෙන මළගනේ හරහා තියෙන මාර්ගය, ඒ වගේම අකරවත්ත ගමට පිවිසුම් මාර්ග කීපයක් තියෙනවා. වෙල මැද පාර ඒ හැම එකක්ම අර ලේඛණයේ තියෙනවා.එතකොට ඒ ලේඛණය මේ වෙද්දි මං දන්නෙ නෑ කාර්මික නිලධාරී මහත්තුරු කොයි විදිහට අධීක්ෂණය කළාද කියලා. පාරවල් දෙපත්තෙ අඩි 9 පළල පාරේ කානු දෙකක් කපලා තියෙනවා.එතකොට අඩි 9 පාරේ කානු දෙකක් කපපුවාම ඒ පාරේ තත්වෙ මොකක්ද කියලා මං හිතනවා ඔබට මතක් කරලා බලන්න පුළුවන්.එතකොට වාහනයක් මාරු වෙන්න බැරි විදිහට කිසිම කාර්මික අධීක්ෂණය තිබුනද දන්නෙ නෑ.එහෙම අධීක්ෂණය තිබුනනම් කාර්මික නිලධාරීන්ගේ දෝෂයක්. ඉතින් ඒ විදිහට එහෙම හිතු මනාපෙට එහෙම කරන්න පුළුවන්ද කියන එක මං මේ සභාවෙන් විමසනවා.විශේෂයෙන්ම හුනුපොලගෙදර මාර්ගය ඇඹවගෙදර කොට්ඨාශෙ මොකද ඒ ගොල්ලො මං දැක්කා ඉල්ලීමක් කරලා තියෙනවා ඒ මාර්ගය තලනකොට ඒ පාරේ යන අය අනේ මහත්තයො මේ පාරේ යන්ඩ බෑ බඩේ තියෙන එක කටට එනවා ඒ නිසා මේ පාර අපට හදල දෙන්න කියලා ඒ ගොල්ලො ඉල්ලීම් කරල තිබ්බ මං දැක්කා. ඉතින් ඒ නිසා මං කියන්නෙ ඒ වගේ අධීක්ෂණයක් නැති වැඩක් කරලා මිනිස්සු අපහසු තාවයට පත් කරන්න එපා කියන දේ.මං මේ අවස්ථාවේදි මේ යෝජනාවෙන් ඒක බලාපොරොත්තු වෙනවා.ඊළඟ තමා මෙතන තියනවා පාරවල් 107 ක ලේඛණයක් එතකොට මේක සභාවක් හැටියට අර මන්ත්‍රිතුමිය කිව්ව වගේ අපි පිරිසක් හැටියට මේ සියල්ලටම වග කියනවා. අපි මේ සභාවෙ මෙතන වාඩි වුනාම ලිය කියවිලිවලට, සංසරණය වන මුදල් වලට වචනෙකින් හරි අපි බැඳෙනවා සභිකවරයෙක් සභිකවරියක් විදිහට.ඉතින් එතකොට ඒවට අපි බැඳෙන වෙලාවෙදි මේ 107 ක ලේඛණය තුල තියෙනවා පාරවල් කීපයක්.ඒ ගැන හරිම අවිධිමත්.දැන් මේකෙ අපේ ගමෙත් ඉන්නවා කිත්සිරි කියලා. කිත්සිරිගෙ ගෙදර සිට සුමනගෙ ගෙදර දක්වා පාර ප්‍රතිසංස්කරණය කිරීම.එතකොට මේ කිත්සිරි කොහෙද? එයා ලංකාවෙද? සභාපතිතුමා මම කියන්නෙ ඒක තමයි සෙල්ලම් ගෙයක් නොවිය යුතුයි කියන එක තමයි මම කියන්නෙ.සභාපතිතුමා මං ඒ කියලා තියෙන කතාවට දැඩිසේ විරුද්ධයි.ඔබතුමාගෙ වාර්තාවෙ තියනවා අපේ මන්ත්‍රිවරු ඇවිල්ලා බොරළු වලවල් බැලුවළු.එතකොට පාලු ගෙයි වලං බින්දා වගේ කොහොම හරි කියන්න තියෙන එක කියාගෙන තියෙනවා.ඒකට කමක් නෑ. අපි හිටියෙ නැනෙ. එතකොට වාර්තාව කියවද්දි දැක්ක බොරළු වලවල් බැලුවළු අපේ මන්ත්‍රිවරු ඒ වගෙන් කොමිස් ගන්න සහ අපට ගමට යන්න බැහැ එලව ගන්නවලු.මං දන්නෙ නෑ මේ ගරු මන්ත්‍රිවරුන්ගෙන් කාටද ඒක කිව්වෙ කියලා. ඉතින් එදා ඔබතුමා කියල තිබුන.ඒ වගේම මම දැඩි සේ මේ ලේඛණයට විරුද්ධයි. මොකද අපිට හිතාගන්න බෑ කොහෙ ඒවා ගැනද මේ කියල තියෙන්නෙ කියලා.මේ වගේ දේවල් අනුමත කරනවා අත්සන් කරනවා කියන්නෙ අපිත් හැල්ලුවට පත්වෙනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

මන්ත්‍රිතුමිය ඔය ලේඛණයේ ස්ථාන සහිතව නැවත ඉදිරිපත් කරන්නම්.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්භානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

2026.01.14 දින මුදල් කමිටුවෙ සාමාජිකයින් 20 දෙනොගෙන් සහභාගී වෙලා තියෙනවා 9 ක්.45% ක සාමාජික නියෝජනයකින් තමයි කමිටුව පවත්වලා තියෙන්නෙ.ඒකට අපිට මුකුත් කියන්න බෑ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

ගණපූර්ණය තිබුනා මන්ත්‍රිතුමිය.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්භානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

මං උදාහරණෙට කිව්වෙ ඒ පාරවල් ලේඛණයේ ගොඩක් තියෙනවා උදාහරණ.මං ඒවයෙ අංක ලියලා තියෙනවා.ඒවා දැන් කියන්න ඕනෙ නෑ.මං හිතනව ඔබතුමා දැන් ඒවා පරීක්ෂාවට ලක් කරයි කියලා.ඊට පස්සෙ අනිත් එක තමයි මේ පාරවල් වල දුරක් මීටර් කීයක්ද ඒ වගේ වාර්තාවක් කමිටු වාර්තාවක් හැටියට තියෙද්දි තියෙන්න ඕන.දුර කොච්චරක්ද? ඒ සඳහා වැය වෙච්ච මුදල කොච්චරක්ද කියලා.දැන් ඔබතුමා කිව්වා අර කථා කරද්දි අපේ රු.17,635,000.00 ආපු එකෙන් පාරවල් 107ක් හදලා තියෙනවා.256 න් 107 ක් සතියක් තුල හැදුවා කියලා.මේ හදපු පාරවල් ගැන මං පොඩි සඳහනක් කරන්න කැමතියි.මොකද අපි ගම්වල මිනිස්සුත් එක්ක ඉද්දි මිනිස්සු ඒ පිලිබඳ විමසනවා.අපිට ඒ සඳහා උත්තරයක් දෙන්න අවස්තාවක් නැති වෙනවා මම කලින් කියපු එක මට හොයාගන්න බැරිවුනා.අනු අංක 79 යටතේ තියනවා උක්කුන්ගේ ගෙදරට යන පාර.මං හිතනවා එයාට ගෙදරට කියන නම වෙන්න ඇති.ඉතින් ඒ නිසා ඒ වගේ දේවල් සංශෝධනය වෙලා ඒවා නිවැරදිව සටහන් කරන්න ඕන.අනිත් එක තමා 98 අකරවත්ත කරල්වැව මාර්ගය මේකෙදි මම විශේෂයෙන් කියන්න කැමතියි.මේක මගෙ ප්‍රදේශයක් නිසා .කිසිම අවස්ථාවක මං කිසිම කෙනෙක් ඉලක්ක කරගෙන කියන්නෙ නෑ.නමුත් මේ පාර අක්‍රමවත් ලෙස කිසිම අධීක්ෂණයක් නැතිව බොරළු හලාගෙන ගිය එක තමා තියෙන්නෙ. ලක්ෂ 6 ක මුදලක් වෙන්කරා.ඒ ලක්ෂ 6 ක මුදල තුල මං හිතනවා පාර බොරළු ටික ෆයිල් කරන එක පැත්තකින් තියන්නකො.මං දන්න තරමට ෆයිල් කරන්නෙ නැතිව පාරක බොරළු කිසිසේත්ම අතුරන්න බෑ.ඔය තියන හදිස්සිය නිසා හලන්න ඕන නම් දිග පළල TO මහත්තයා හෝ කව්රු හරි නිලධාරියෙක් ගිහිල්ලා මනින්න ඕනි.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

දැන් ඔබතුමිය කියන්නෙ එහෙම කරලා නෑ කියලද.මනින ක්‍රම අනුව තමයි මැනලා පාරවල් හදලා තියෙන්නෙ.ඒ නිසා ඒ ක්‍රමවලට ගැරහුවට වැඩක් නෑ.ඒ නිසා ඔබතුමිය උපහාසයට ලක්වෙන්න එපා.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්භානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

මං උපහාසයට ලක් වෙනවද කියන එක මං කණගාටුවට පත් වෙනවා ඔබතුමා එහෙම කිව්ව එක ගැන.මම මේක කියන්නෙ මං කිව්වනෙ මං මූණමල්දෙණිය කොට්ඨාශෙ විතරක් නෙමේ කියලා.විඩියෝ ගත කරපු ඒවා තියෙනවා බොරළු ටික හලා ගෙන යන ඒවා.ඒක ලෙවල් එකක් නැතිව රෝලකින් තලලා ලක්ෂ 6 ක මුදලක ඒපා ර හැදුවා කියන එක ඔප්පු කරන්න තාක්ෂණික නිලධාරීන්ට අභියෝගයක් කරනවා ඒ වටිනාකම තුල ඒ පාර තියනවා කියලා තහවුරුවක් දෙන්න කියලා.අනිත් එක මගෙ ඉල්ලීම තමයි මෙන්න මේ පාරවල් වල මුදල දාලා නැති නිසා මං දන්නෙ නෑ. නමුත් කාර්මික නිලධාරීන්ගේ ලේඛණයේ තියනවා මීටර් 300 ක බොරළු අතුරන්න රු.550,000.00 ක් වෙන් කරලා තියනවා.අනිත් එක තියෙනවා1,135,000.00 ක් තියෙනවා බොරළු අතුරන්න මීටර් 700ක්. මං ඒ පාර තමයි කිව්වෙ අගල් කපලා තියෙනවා තාම බොරළු අතුරලා නෑ.වැඩ අවසන් කරලා කියන 107 ලේඛණයේ තමා ඒක තියෙන්නෙ.මං ඔබතුමාගෙ දැනුවත් වීම සඳහා කියන්නෙ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

මන්ත්‍රිතුමිය දැනුවත් කිරීමක් කරන්න ඕන. වැඩ අවසන් කියලා කියන්නෙ මුළු මාර්ගෙම වැඩ අවසන් කියන එක නෙමේ. පටන් අරගෙන තියෙන්නෙ තාම වැඩ කරන්න තියෙනවා. ඒ නිසා මුදල් මදි වෙලා තව විසිගානක් තීයෙනවා භාගෙට හදපු පාරවල්.පාරවල් සියල්ලම අපි ගිය අවුරුද්දෙ වැඩිපුර උපදවපු ආදායම කෝටි 5 ක මුදලකින් කෝටියක් වෙන්කරනවා ඒ පාරවල් සම්පූර්ණයෙන් අවසන් කරන්න.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්භානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

ඒක තමා. පැහැදිලි නෑ කියන එක තමයි මං කියන්නෙ.ලේඛණගත කරද්දි ඒවා නිවැරදිව ලේඛණගත කරන්න. ඉතින් මං නැවතත් ඉල්ලීමක් කරනවා ඒ ආපදාවට ලක්වුන මේ වන විට ඇහැගැටිලා නැති මාර්ග මං දිලා තියෙනවා.කලින්ම මං දීලා තියෙනවා.ආපාදාවට ලක් වුන පාරවල් ටික.ඒ පිලිබඳවත් අවධානය යොමු කරලා මිනිස්සුන්ගේ ජීවන මග ගමෙන් එළියට එන්න තියෙන මාර්ග අපි හැකි තරම් ඒ මාර්ග හදලා

තියෙනවා. නමුත් ඉතිරි වෙච්ච ඒ පොඩි ප්‍රමාණයට ඔබතුමාලා දායකත්වය දක්වලා විනිවිදභාවයෙන් සාර්ථකව හදන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මන්ඩලයෙන් අවසරයි.ඒ වගේම අපේ ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.සද්නා දිල්හානි ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාවටම අදහස් කීපයක් එකතු කරන්න ඕන.ඊට කලින් අද දවසෙ ඔබතුමාට අමතක වුනාද දන්නෙ නෑ ඔබතුමාගෙ පඹුවස්නුවර කොට්ඨාශෙ නවක ගරු මන්ත්‍රී තුමා එතුමට සුභ පතනවා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට අද දවසේ සභාවට පැමිනියා.එතුමාට සුභ පතමින් මම ඉතාම කෙටියෙන් වචන කීපයක් කථා කරනවා.ගරු සභාපතිතුමනි දියීවා සුළි කුනාටුවෙන් ආපදාවට ලක් වුන මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම ලෙස තමයි මේ යෝජනාව සකස් වෙලා තියෙන්නෙ.විශාල කරුනු රාශියක් අපේ සද්නා දිල්හානි මන්ත්‍රීතුමිය කථා කලා.මං වැඩියෙ කථා කරන්නෙ නෑ. ඔබතුමා කිව්වා වගේ සාමාන්‍ය මාර්ග ප්‍රතිසංස්කරණය කරද්දි ක්‍රමවේදයක් තියනවා. ආපදාවට ලක්වෙච්ච පාරවල් දෙසැම්බර් 31 වෙද්දි ඉවර කරන්න ඕන කිව්වට දැන් ඇත්තටම සාමාන්‍ය ක්‍රමවේදය තමා යම් රජයේ මුදලක් වියදමක් කරන කොට අනිවාර්යයෙන් සවෙච්ඡා සංවිධානයකින් අත්සන් කරන්න ඕන.අපි ඒක තාක්ෂණ නිලධාරිටත් කිව්වා.එතුමාවත් දැනුවත් කලා.ඔබතුමාගෙ ආණ්ඩුව විනිවිදභාවය වැඩිකමට එහෙම කරන්නෙ නැද්ද දන්නෙ නෑ. සාමාන්‍යයෙන් පුද්ගලයන්ට රජයේ මුදල් ලබා දෙන ක්‍රමවේදයක් මම නම් අහලවත් නෑ.දන්නෙත් නෑ.ඒ නිසා අළුත් ක්‍රමවේද අපි දන්නෙ නෑ.කොහොමද කියලා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

පුද්ගලයන්ට මුදල් ලබා දෙනවා කියන්නෙ?

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

දැන් ඔබතුමාලා ඔය බොරළු ලබා දුන්න මුදල් ලබාදෙන්නෙ කාටද?

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

සේවා සපයපු අයට.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ක්‍රමවේද තියනවද? කුමවේදයක් නැනෙ මෙතන.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

මිළ ගණන් කැදවලා ඒ අදාල ක්‍රමවේදයක් ඇතිව තමයි කරලා තියෙන්නෙ.එහෙම නෑ කියනවනම් ඔබතුමා පෙන්වන්න.හිත හිත ඒවා මේවා කියවන්න ලෑස්ති වෙන්න එපා මෙතන

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

හිතෙන ඒවා නෙමේ.ක්‍රමවේදයක් නැති හින්දා තමයි ක්‍රමවේදයට පාරට බොරළු අදින කොට දැන් ඔබතුමා කියනවා හදිස්සියෙ ඉවරකරනකොට බොරළු ෆයිල් කරන්න ප්‍රමාණ මනින්න බෑ කියලා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

බෑ කියලා කිව්වෙ නෑ.නමුත් අපිට දුන්න උපදෙස් අනුව අපි කටයුතු කලේ.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

එහෙම කරලා තියෙනවද? ඔබතුමාලා ඒ ක්‍රමවේදයෙන් බැහැරව තමයි කටයුතු කරලා තියෙන්නෙ.එතකොට දැන් සමහර පාරවල්වලට දියීවා සුළි කුනාටුව ඔබතුමාලගෙ කණ්ඩායමට ආශිර්වාදයක් වුනා මං දකින විදිහට. බොරළු පාරක් හදලා පුදුම විදිහෙ සතුටක්නෙ ලබන්නෙ.සතුටු වෙන්න එපා.බොරළු පාර හදලා. ඔබතුමාලා මේ වංචාව, දූෂණය මේවගෙන් තොරව ආව විදිහට තමයි කතා කරන්නෙ.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

තමුන්නාන්සෙට අභියෝග කරනවා. ලක්ෂයක් දාපු පාරක කරලා තියෙනවා ලක්ෂ තුනක වැඩ.ඇස්තමේන්තුවල මුදලට වඩා වැඩ කරලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

අභියෝග කරන්න දෙයක් නෑ.සද්නා දිල්හානි මන්ත්‍රීතුමියගෙ යෝජනාවට තමයි මම කථා කරන්නෙ.ඒ ලැයිස්තුවෙ තියනවා ඔබතුමා කියන්නකො ගෙවල් දෙකකට යන පාරකට කොස්දෙනියෙ බොරළු දාලා තියෙනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

මේ මුදල් වියදම් කරලා තියෙනවනම් ඔබතුමා පෙන්වන්න.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

මේ මුදල් වියදම් කරලා නෑ.අපි කිව්වට පස්සෙ අයින් කරා.ඒ නිසා අපිත් සතුටුවෙනවා දියිවා සුළි කුනාටුව ඔබතුමාලට වෙස්වලාගත්ත ආශිර්වාදයක් වුනා. කොහොමවුනත් විනිවිදභාවයෙන් වැඩේ කරන්න.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**

දිල්හානි මන්ත්‍රීතුමිය අකරවත්ත කරල්වැව මාර්ගය ගැන කථා කලා. එතුමිය මේ ලිස්ට් එකේ මන්ත්‍රීතුමියක් නිසා මුළු ආසනේම මාර්ග සංවර්ධනය ගැන කථා කරන්න පුළුවන් කියලා කථා කලා.ඒකට අපේ රංජි මන්ත්‍රීතුමත් යම්කිසි අදහස් ප්‍රමාණයක් එකතු කරා. ඉතින් මං හිතන්නෙ අපි මේ ආණ්ඩුපක්ෂෙ මන්ත්‍රීවරු විදිහට පළමුකොටම ඔබතුමාට ඔබතුමියට ඇතුළු සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.මොකද මේ ඊළගට එන මැතිවරනයකදි අපි පරදී කියලා තියන බය නිසා ඔබතුමාලා අපිව ගලවා ගැනීමට මහන්සි වීම පිළිබඳව.ඔබතුමාලා අපේ අයවැය පැරැද්දුවනෙ. අපිව දිනවන්නද? මුදල් කමිටුව පරාද කරන්න හැදුවා අපිව දිනවන්නද?දැන් මොකද දන්නවද වෙලා තියෙන්නෙ.කොරොස් කටෙත් අත දා ගන්න බැරි තත්වයක් තමයි දැන් ඇවිත් තියෙන්නෙ.ඒක තමයි හදිස්සිය. පොඩ්ඩක් ඉන්න.තව ඡන්දෙ තියන්න අවුරුදු 3 ක් විතර යනවා.දුක් වෙන්න එපා. ගරු මන්ත්‍රීතුමා ඔයාට අපි ආදරෙයි. අපි සේරටම ආදරෙයි.ඒක නිසා මන්ත්‍රී වෙන්න, සභාපති වෙන්න, තව තව ඉලක්කවලට යන්න පුළුවන්.දැන් තියෙන්නෙ ඒක නෙවෙයි. අපි පොඩි බබාලා නෙවෙයි.අපිට තේරෙනවා ඔය කියන කාරනාව මොකක්ද කියලා.මේ පාරවල් හදන්න රු.17,635,000.00 ආවේ නිකම්ම ඔහේ ගලාගෙන ආවා නෙමෙයි.ඊ 12 ට පාරවල් මැන්න කිව්වා නේද ගරු මන්ත්‍රීතුමිය.ඊ 12 ට නෙමේ පාන්දර 1,2 වෙනකම් TO මහත්තුරු පාරවල් මැන්නා.ඒ ගොල්ලන්ගෙ කැප කිරීම ඉතිහාසෙ පළමුවතාවට එහෙම සිද්ධ වුනේ.ඊ 2,3 වෙනකම් ඒ ගොල්ලො වැඩ කලා. කාර්ය මන්ඩලය එකට වැඩ කළා.ඒකට ගෞරවයක් දක්වන්න ඕනෙ. ඔබතුමාලා ඇතුළු සියළු දෙනා වෙනුවෙන් තමයි ඒ පාරවල් හදලා තියෙන්නෙ.ඔබතුමාලා දන්නැති සිද්ධි කීපයක් තියෙනවා.ඒ නිසා මේ ටික හොඳින් අහගන්න.මේ පාරවල් ඉතා ඉක්මනින් නම් කරලා එවන්න කිව්වම පුරුදු පාර පුරුද්ද එහෙම නැත්තම් පෙර ක්‍රියාවලියේ අත්දැකීම විසින් මොකක්ද දන්නවද සිද්ධ වෙන්න ගියෙ.පාරවල් 20 ක් විතර නම් කරලා යවන එක තමයි සිද්ධ වෙන්න ගියෙ.අපි ඊ 1,2 වෙනකම් සභාපතිතුමා අපි කණ්ඩායම එකතු වෙලා පාරවල් 256 ක් නම් කරලා යැව්වා. ඒක හින්දා තමයි රු.17,635,000.00 ක් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට ආවේ පාරවල් හදන්න.ඊළඟට ඒ පාරවල් ටික හදන්න ඉතා ඉක්මනින් හදන්න ඕන නිසා අපි අදත් පුදුම ගෞරවයක් දක්වනවා ඒ තාක්ෂණ නිලධාරීන්ට.ඒ ගොල්ලො ඊ 1, 2 වෙනකම් ඇස්තමේන්තු හදලා තමන්ගෙ වෙලාව ගැන හිතන්නැතිව , කෑම ගැන හිතන්නෙ නැතිව පාරවල් සේරගේම ගිහිල්ලා පාරවල් ටික මැනලා මෙන්න මේවා මේ විදිහට කරමු කියලා තමයි ඒ ගොල්ලන්ගෙ අනුමැතිය යටතේ ඒ ගොල්ලන්ගෙ එකඟතාවය යටතේ පාරවල් වලට බොරළුදාලා තියෙන්නෙ.දිල්හානි මන්ත්‍රීතුමිය කිව්වා පාරවල් වල පාර දෙපැත්තෙ කපලා වාහනයක් මාරු වෙන්න බෑ කියලා.මටත් ඔය කරුණ තිබ්බා ගරු මන්ත්‍රීතුමියනි මගෙත් නොදන්නකම නිසා. ගරු සභාපතිතුමනි ඉතින් මං අපේ ප්‍රධාන තාක්ෂණ නිලධාරීතුමාගෙන් ඇහුව මහත්තයා දැන් මේ පාරවල් කැඩෙන එකට අපට සාධාරණ හේතු පේනවා එතකොට අපි හිතන එක හරිද කියලා තේරුම් කරලා කියන්න කියලා. මොකද දැන් පාරවල්වලට කාණු පද්දතියක් ඕන කියලා හැබැයි අපි හිතන්නෙ මොකක්ද පාරේ වතුර වත්තට දාන්න ඕන කියලා. දැන්මං හිතනවා බොහෝ දෙනෙක්ගෙ අදහස ඒක කියලා.ඒක වැරදියි මන්ත්‍රීවරුනි වත්තෙ වතුර පාරේ කානුව දිගේ කිසිම පුරවැසියෙකුට කරදරයක් නොවන විදිහට ඒ වතුර ටික අදාල තැනකට යවන්න ඕන. ඒක තමයි නීතිය, ක්‍රමය අපේ ඔළුවෙ තියෙන්නෙ මොකක්ද පාරේ වතුර වත්තට බස්සන්න ඕන පහත් තැනින් ඒ ගැන පොඩ්ඩක් අවබෝධය තියා ගන්න මොකද ඔයගොල්ලො හිතේ තියාගෙන ඉන්නවා පාරේ වතුර වත්තට බස්සන්න.එහෙම බස්සන්න බෑ. වතුවල කානු වතුර කානු දිගේ යවන්න ඕන.ඒක නිසා තමයි පාරේ දෙපැත්තෙ කානු කපලා තියෙන්නෙ. ඒ පාරවල් හදල ඉවර නෑ තාම. ඔබතුමාලා මොකුත් දන්නෙ නැතිව මං කිව්වෙ අර කොරොස් කටෙත් අත දා ගන්න බෑ කියලා. එහෙම වෙන්න එපා.මේක බොහොම සාවධානයෙන් අහන්න. සභාපතිතුමනි, මේ පාරවල් හදලා ඉවරද? ඇහුවද කවුරුවත් ඇහුවද විපක්ෂෙ මන්ත්‍රීවරු.ඇහුවෙ නෑ.ඉස්සරලා අහන්න මේ පාරවල් හදලා ඉවරද කියලා. ගරු මන්ත්‍රීතුමාලා හැමදාමලේ කෝප කරගන්නෙ අපි ඒ ගොල්ලො එක්ක

විරුද්ධවාදීන් කියලනෙ.එහෙම නෑ.ඔයගොල්ලො හදිස්සි වෙලා අවශ්‍ය තොරතුරු ටික අරගන්නෙ නැතිව මෙතන ඇවිල්ලා වෙන මොකක් හරි කිව්වම පොඩි අවුලක් ඇති වෙනවා.අවශ්‍ය තොරතුරු ගන්න සභාපතිතුමාගෙන් ලේකම්තුමියගෙන්, නිලධාරිතුමියගෙන් අරගෙන ඊට පස්සෙ අපි කථා කරමු.අපි කරන වැඩේට අපි හිතන විදිහට ඔයාලට කවදාවත් ලං වෙන්න බෑ.එතෙන්ට.ඔය ගොල්ලන්ගෙ තියෙන්නෙ මොකක්ද දන්නවද, ආත්මාර්ථකාමීකම ඔයාලගෙ පෞද්ගලික ඉලක්ක ජයග්‍රහණය කරන්න.අපේ ඒ කිසිවක් නෑ.මම කියන්නෙ හරියට තොරතුරු ටික දැනගෙන මේ කථාවට සෙට් වෙන්න වෙනවා.අනික තමා කියන්න ඕන ලේකම්වරු ,මන්ත්‍රිවරු මේ වැඩේ ඇතුලෙ එක තඹ සතයක් හොරකම් කරලා නෑ.වංචා වෙලා නෑ.නාස්ති වෙලා නෑ.හරිද. හෘද සාක්ෂියෙන් අහන්න ඒක දරාගන්න බැරි අවුලක් නෙ තියෙන්නෙ.හැබැයි එකක් කියන්න ඕන.අපි මේ රට හදන්නෙ අපිට විතරක් නෙමේ.ඕගොල්ලන්ටත් එක්ක.මේ ආර්ථික ප්‍රතිලාභ භුක්ති විදින්නෙ නැද්ද? ඕගොල්ලන්ට කවදාවත් මේකට ලං වෙන්න බෑ.මං ආරාධනා කරනවා එන්න අපිත් එක්ක.

<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම උපසභාපතිතුමා, ඇතුළු මන්ත්‍රි මන්ඩලයෙන් අවසරයි. අපේ ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.අපේ උපසභාපතිතුමා ලොකු කතාවක් කියාගෙන ආවා මං හිතන්නෙ එතුමා කිතුලි ගහක නැගලා තෙලිජ්ජ ටිකක් ගහලා එන ගමන් තණකොල කපන්න ගිහින් තමයි ඒ බැස්සෙ.දැන් ඔබතුමාලට මං හිතන්නෙ අපේ මන්ත්‍රිවරු කියපු කාරනා තේරුනාද?මේ කියන්නෙ ඔබතුමාලා මේකෙන් හොරා කෑවා කියලවත් මොකවත් නෙමේ.හොරා කෑවා කියලා නෙමේ කියන්නෙ. කවදාහරි දවසක පරීක්ෂන කටයුත්තක් සිදුවුනොත් හොරු වෙයි කියලයි එහෙමයි ඒ කියන්නෙ.මේ හැම දෙනාම කතා කලේ මේකෙ ක්‍රමවේදය පිලිබඳව තමයි.ඒක ඔබතුමාලා වටහගන්න ක්‍රමවේදය තමයි වෙනස්.දැන් මගේ ගමෙනුත් බොරළු කැපුවා.බොරළු කපපු හාදයා මගෙ හිතවතෙක්,ඥාතියෙක්, ඉතින් ඔබතුමාලා දැන් කියනවා නියමයි.සුපිරි බොරළු කැට 3 ට 1 තියෙනවා.අනුපාතයක් තියනවා.ඔබතුමාලා එහෙම කියනවනෙ.එහෙම නෑ සභාපතිතුමා මං ඒ වත්ත ගැන හොඳට දන්නවා.ඒ වත්තෙ බොරළු කපලා කපලා ඉවරවෙලා පස් දාලා වහලා තියෙනවා. ඔබතුමාලා මේක ඇදලා දෙන්න කියපු කට්ටිය මේ සියළුම දේවල් ඔබතුමාලා නම් කරපු පාරට ඇදලා තියෙනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>

දැන් ඒ ඇදලා තියෙන්නෙ ජරාව කියලද ඔබතුමා කියන්නෙ. හිතළුනම් කියන්න එපා මන්ත්‍රිතුමා.ඔබතුමා කියන පාර බලන්න යන්න ඕන.

<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>

දැන් යන්න එපා.වර්ෂාව කාලෙට ගිහිල්ලා බලන්න. කිරිමැටි දැන් කොන්ක්‍රිට් වෙලානෙ මේ පැවිල්ලට.කිරිමැටිවල ඇවිදලා තියනවනෙ. තිස්සව පැත්තෙ නම් ගල් තියෙන්නෙ ඒවා එරෙන්නෙ නෑ.අත්දැකීම් වලින් තමයි අපි කියන්නෙ.ඔබතුමාලත් අපි කරපු ඒවා කරනවනම් මේ කියන විදිහට කෝ අර පුනරුදය.ඒකයි මේ කියන්නෙ.එතුමිය කියන්නෙත් ක්‍රමවේදයක් නෑ කියලා.මෙතුමියත් කියන්නෙ ක්‍රමවේදයක් නෑ කියලා. මම කියන්නෙත් ක්‍රමවේදයක් නෑ කියලා.ඔබතුමාට දවසකුත් මම කිව්වනෙ කාන්ති මහත්මියගේ නිවස ළග පාර හදනකොට අපිත් මේකට උදව් වෙන්නම් අපේ මංජුල මහත්තයට මං පෞද්ගලිකව කිව්වා. එවෙලෙ එතුමා මන්ත්‍රිතුමා නෙමේ.මහත්තයා මගෙනුත් උදව් ඕන නම් ඉල්ලන්න.මගෙනුත් ෆුල් සපෝට් එක දෙනවා. මගෙ ගමට යන පාර.ගමට යන පාරෙත් බොරළු කියුබ් කරන ක්‍රමවේදයක් ගැන මේ සියළු දෙනා කතා කලා.සභාපතිතුමා දන්නැනෙ ඒ අවදානම් තත්වය.දැන් මේ අපේ ගේ ඉස්සරහ පාරට බොරළු දාලා තියෙන්නෙ ෆයිල් කරලද? නෑ නෙ.දෙපැත්තෙම බොරළු ගෙනල්ලා බානවා. ග්‍රාම නිලධාරී කාර්යාලය ගාව ගොඩවල් ගොඩවල් දාලා තිබුනා. කොච්චරක් එනවද ? කොච්චරක් තියෙනවද? සුගතාරාම මාවතේ තියෙන්නෙ. ගිහිල්ලා බලන්න.ඒ පාර අනුමත වෙලා තිබුනෙත් අඩි 10 ට 11 ට.ඒකත් අර කව්ද කිව්ව වගේ පටු කරලා තියනවා.ඒකත් දැන් මේ මතක් කරනවා මං මේ වෙලාවෙ.ඒකෙත් බොරළු ෆයිල් වුනේ නැති හින්දා.මේ හැමදෙනාම කියන්නෙ සභාපතිතුමා මේකෙ ක්‍රමවේදය ගැන.මේ සභාවෙ පාරවල් ඔබතුමාගෙත් නෙමේ.මගෙත් නෙමේ.අපේ නිලේ ඉවරවුනාමත් අපි මහජනතාව විදිහට මේ පාරවල්වල යන්න ඕන.ඉතින් ඒ නිසා මේවා ක්‍රමවේදකට හදලා දෙන්න කියලයි

අපි මේ කියන්නෙ.ඒ කරන ක්‍රියාපටිපාටි අනුව එහෙම කරන්න. උපසභාපතිතුමා කියනවා හරි දියුණුයිලු. දැන් මොකක්ද එක වෙලාලු.අනේ සභාපතිතුමා මට නම් දැන් ඉස්සර පස්ස පැත්තට අත දෙසැරයක්ගියා.එක පාරක් මල පහ කරලා හෝදගන්න ගියා.අනිත් එක පර්ස් එක ගන්න ගියා.දැන් මල පහ කරලා හෝදගන්න දෙයක් නෑ.අපිට කන්න නෑ. හිඟයක් තියෙනවා.සභාපතිතුමා ඔබතුමාට තේරෙන්නෙ නැති වුනාට.කන්න නෑ කියන එක එහෙම දෙයක් නෙමේ.දැන් ඔබතුමාලා අර්ථකථනය කරන්න හදන්නෙ පාරවල් වලින් ගසා කෑවා කියලනෙ.එහෙම දෙයක් නෙමේ මං මේ කියන්නෙ.අපේ පෞද්ගලික ආර්ථික තත්වය.ජනතාව තමා අපිට කියන්නෙ.ඒ හින්දා ඔය කියන සංවර්ධනය රටට ලං වෙලා නෑ. උප සභාපතිතුමා.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු සභාපතිතුමා යෝජනාව ඉදිරිපත් කරපුවම ඒක අවසන් කිරිමේ අයිතිය තියනවා අදාල මන්ත්‍රිතුමාට මන්ත්‍රිතුමියට.මගෙ යෝජනාව නිසා ඒකෙ අවසානෙ තොරතුරක් කියන්න විශේෂයෙන්ම මගෙ යෝජනාවට අදහස් දක්වපු අයට ස්තුති කරන්න.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා පෙ.ව.11.22 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා පෙ.ව.11.22 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

මන්ත්‍රිතුමිය යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාට හෝ මන්ත්‍රීවරියට අවසාන අවස්ථාවක් දෙන්නෙ මොනවා හරි ඒ ඉදිරිපත් කරපු කාරනාවට ප්‍රති තර්කයක් ගේන්න විතරයි.නැවත ඒ කාරණාව කියන්න නෙමේ.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

මං කියන්නෙ එහෙම තමයි.එවෙලෙ කියපු ඒවා මං කියන්නෙ නෑ.මං කියන්නෙ දැනිච්ච දේ.මොකද මගෙ යෝජනාවට දක්වපු අදහස්වලින් මං ගත්ත දේ මම බොරු කියලා නෑ පාර දෙපැත්ත කපලා තියන එක. උපසභාපතිතුමා බාර ගත්තා.ඒක ඇත්ත.අනිත් එක තමයි ඒ පාරවල් කපද්දි අපි හිතළු විදිහට ඒ කපපු එකේ හානිය කිව්ව එක එතුමා දැකලා තිබුනා.ඒක පෞද්ගලිකව හිතලා තිබුනෙ මෙහෙම කැපුවොත් හොදයි කියලා. මං ඒකයි කිව්වෙ TO නිලධාරීන්ගේ අධීක්ෂණයක් නැතිව කරා කියලා. කාර්මික නිලධාරීන්ගෙන් උපදෙස් අරගෙන කරොත් හොදයි කියන එකයි. මමත් ඒක පිලිගත්තා. ඔයාලත් ඒක පිලිගන්න.අනිත් එක තමයි මේකෙ ගෙවීම් කරන එක ගැන මං කිව්වා.ඒ ආයතනයට ගෙවීම් කිරීමට මුදල් කමිටුවෙ නිර්දේශය ලැබුනහම නිර්දේශය ලැබිලා ඉවරයි.කාර්මික නිලධාරීන්ගෙ නිර්දේශය නැතිව කිසිම ගෙවීමක් කරන්න බෑ.අවසාන වශයෙන් කාර්මික නිලධාරීන්ගෙ නිර්දේශය නැත්තම් ගෙවීම් කරන්න බෑ.නමුත් මෙතන ගෙවීම් කිරීමේ අවසරය මුදල් කමිටුවේ අනුමත වෙලා තියන එකයි මං කිව්වෙ.බොහොම ස්තුතියි.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

එහෙම කිසිම ගෙවීමක් සිද්ධ කරන්නෙ නෑ.අදාල පටිපාටිවල විදිහට තමයි සිද්ධ කරන්නෙ. තවම මුදල් ගෙවමින් යනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා පෙ.ව.11.24 ට පමණ ගරු සභාවට පැමිණියා.

**ඒ අනුව 2025 නොවැම්බර් මස පැවති ගංවතුර තත්වය මත සෝදා පාලුවට පත් ග්‍රාමීය මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විශේෂයෙන් ගමට පිවිසීමට සහ නිතර ගමන් කරනු ලබන මාර්ග සඳහා විශේෂ අවදානය යොමු කර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>IV.ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).IVදරණ යෝජනාව</u>**
මා විසින් ඉදිරිපත් කරනවා.

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව 2026.01.22 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති සැකසිම කමිටුව විසින් නිර්දේශ අංක 05,06,08,09, යටතේ පහත සදහන් වෙළඳ සංකීර්ණ වලට අයත් නව තක්සේරුව පිළිගැනිමත් ගිවිසුම්ගත විය යුතු කාලය වසර තුනක් ලෙස තිරණය කිරිමත් යෝජනා කරනවා. ඒකට අනුව

| අනු අංකය | වෙළඳ සංකීර්ණය | කඩ කාමර අංකය | තක්සේරු වටිනාකම | ගිවිසුම්ගත විය යුතු කාලය |
|---|---|---|---|---|
| 01 | හෙට්ටිපොල ඩි වෙළඳ සංකීර්ණය | 1 | 9000.00 | 2026/03/01 සිට 2029/02/28 |
| | | 2,3,4,5, | 6250.00 බැගින් | |
| 02 | කඹුරාපොල වෙළඳ සංකීර්ණය | 1,2,3,4,5,6,7,8,9,10 | 2500.00 බැගින් | 2026/03/01 සිට 2029/02/28 |
| 03 | හෙට්ටිපොල ස.තො.ස ගොඩනැගිල්ල | | 72000.00 | 2026/04/01 සිට2029/03/31 |
| 04 | විජය උදාගම වෙළඳ සංකීර්ණය | 1,2,7 | 1500.00 | 2026/03/01 සිට2029/02/28 |
| | | 3,4,5,6 | 1250.00 | |
| | | 8 | 1750.00 | |

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාවෙන් අවසරයි. සභාපතිතුමා විසින් ගෙන ආ. යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් ඉහත සදහන් වෙළඳ සංකීර්ණ වලට අයත් නව තක්සේරුව පිළිගැනිමත් ගිවිසුම්ගත විය යුතු කාලය වසර තුනක් ලෙස තිරණය කිරිමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

V.<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).V</u>දරණ යෝජනාව

විශේෂ යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව සතු ඉඩම් වල මාර්ගවල පවතින අනතුරුදායක ගස් ඉවත් කිරීම පිලිබඳව 2026.12.16 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති සහ සැලසුම් කමිටුවේ තීරණ අංක 25 යටතේ පහත සඳහන් ස්ථානයන්හි ඇති ගස් වල වටිනාකම තක්සේරු කර එම ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනිමට යෝජනා කරනවා.

1.හෙට්ටිපොල බුලත්පොල භූමියේ ඇති කොහොඹ ගස

2.ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඇති පොල්ගස

3.රයිගම්වත්ත සභාව සතු ඉඩමේ ඇති කොහොඹ ගස

4.බස්වත්ත කම්කරු නිවස ආසන්නයේ ඇති කොහොඹ ගස්06/පොල්ගස් 03

අනතුරුදායක ගස් නිසා කඩා වැටෙන්නත් පුළුවන්. පහුගිය සුළි කුනාටුව වෙලාවෙත් අපේ කම්කරු නිවාස සංකිර්ණෙ මතට ගස් විශාල ප්‍රමාණයක් ඇද වැටුනා.ඒ නිසා මේ ගස් ටික ඉවත් කරන්න අපි එතනම ප්‍රසිද්ධ වෙන්දේසියෙ වෙන්දේසි කරන්න තමයි සූදානම් කරලා තියෙන්නෙ.

<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, එදා කමිටුවට දැම්මා එදිරිසිංහ හෝටලය අසල ඇති මාර්ගයේ විශාල මාර ගස

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

මන්ත්‍රීතුමිය වෙන්දේසි කරන්න තියෙන ගස් ටික තමා මේ. ඒ ගස වෙන්දේසි කරන්න බෑ.දැව සංස්ථාවට භාර දීම සුදුසුයි කියලා යෝජනාවට ගමු. අපිට මාර්ගවල තියෙන ගස් සභාවට ගන්න බෑ. ඒ අනුව කඩවලගෙදර තුත්තිරිපිටිගම එදිරිසිංහ හෝටලය අසල ප්‍රාදේශීය සභා මාර්ගයේ ඇති මාර ගස - දැව සංස්ථාවට භාර දීම සුදුසුයි කියලත් මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සභාපතිතුමා විසින් ගෙන ආ. යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව සතු ඉඩම් වල මාර්ගවල පවතින ඉහතින් සඳහන් ඇති ස්ථානවල ඇති අනතුරුදායක ගස් වටිනාකම තක්සේරු කර එම ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීමත්, කඩවලගෙදර තුත්තිරිපිටිගම එදිරිසිංහ හෝටලය අසල ප්‍රාදේශීය සභා මාර්ගයේ ඇති මාර ගස,දැව සංස්ථාවට භාර දීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා පෙ.ව.11.26 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා පෙ.ව.11.27 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා පෙ.ව.11.27 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**VI.ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව**

මා විසින් ඉදිරිපත් කරනවා.

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල කැලියාව i සහ ii ඉඩමේ හා හෙට්ටිපොල බස්නැවතුම්පල භූමියේ ඇති අනතුරුදායක පොල්ගස් ඉවත් කිරීම පිළිබඳව 2026.01.14 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති සහ සැලසුම් කමිටුවේ තීරණ අංක 19 යටතේ අනුමැතිය ලැබී ඇත.අදාල ගස්වල වටිනාකම තක්සේරු කර එම ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීමට යෝජනා කරනවා.

1.කැලියාව i ඉඩමේ පොල්ගස් 03

2. කැලියාව i i ඉඩමේ පොල්ගස් 02

3.බස්නැවතුම්පල භූමියේ පොල්ගස් 01

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සභාපතිතුමා විසින් ගෙන ආ. යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය අයත් හෙට්ටිපොල කැලියාව i සහ ii ඉඩමේ හා හෙට්ටිපොල බස්නැවතුම්පල භූමියේ ඇති අනතුරුදායක පොල්ගස් වටිනාකම තක්සේරු කර එම ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

බොහොම ස්තුතියි.මීළඟට අද දිනයේ සභාවට නවක මන්ත්‍රීවරයෙක් ලෙස සම්බන්ධ වෙච්ච මංජුල ප්‍රසන්න මල්ලවආරච්චි මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා මේ සභාව අමතන ලෙස.

**ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

සුභ උදෑසනක් හැමෝටම.අපේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලය ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය මේ සියළු දෙනාගෙන් අවසරයි.අද මුල්ම වතාවට මෙයට සහභාගි වෙන්නෙ. ඇත්තටම මේ

පුරප්පාඩුවට මාව පත් කිරීම සම්බන්ධව පක්ෂයට ස්තුතිවන්ත වෙනවා.ඇත්තටම මෙතන කටයුතු හරි ආකාරව කරන්න සැම මන්ත්‍රීවරයකුගෙම සහයෝගය අපට අවශ්‍ය වෙනවා.ඉතින් ඒ සහයෝගය ඉදිරියටත් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.ඒ වගේම අර මතුවුන කාරනා කිහිපයකුත් මෙතනදි කියාගන්න හම්බවුනොත් හොඳයි කියලා හිතෙනවා.දැන් මේ සමහර මන්ත්‍රීවරු අපි කරපු පාරවල් නිරීක්ෂණය කරන්න ගියා.ඒවා හොයලා බැලුවා.ඒවගෙ අඩුපාඩු කියන්න ගියා.හැබැයි ඒ ප්‍රදේශවලින්ම ඒ අයට ආවා ඒකට විවේචන.සමහර අය බැනලා ගහන්න ගිහිල්ලා එලෙව්වා.ඉතින් එහෙම සිදුවීම් වෙනකොට මෙතන තමයි අපිත් කථා කරන්නෙ.හැබැයි අපි දකිනවා මෝල්ගස් ගිල්ලා වගේ ඇවිල්ලා මෙතෙන්ට අපි පාරවල් හොඳට හදද්දි ඒවට විරුද්ධ වෙනවා.ඉදිරියට මේ කටයුතු සාර්ථකව කරගෙන යන්න හැමෝගෙම සහයෝගය ලබා දෙන්න.නිවැරදිව හොයලා.හරියට හොයලා බලලා කටයුතු කරන්න කියලත් මේ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා පෙ.ව.11.29 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා පෙ.ව.11.29 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. අශෝක මාපා හේරත් මහතා පෙ.ව.11.29 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයෙනුත් අවසරයි.මේ සියල්ල දරාගෙන ඉන්නකොට අපිටත් කතා කරන්න අවස්ථාවක් අවශ්‍යයි කියලා හිතුනා.මං පළමුවෙන්ම සුභ පතනවා මාගේ ගම් ප්‍රදේශයේ අළුතින් පත් වූ මන්ත්‍රීතුමාට. අපි මේ කරන වැඩසටහන්වල වැරැද්දක් දකින්නෙ පස්සෙ ගිහින් හොයන්නෙ ඒ වෙලාවට අපිට ගහල එලෙව්වා කියන තත්වෙට පත්වෙන්නෙ ඔබතුමා ගරු සභාවක් විදිහට ඔබතුමාගෙ සභාවෙ අපි සියළුදෙනාම ඔබතුමාගෙ මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්.මේ අවට සභාවලත් ගත්තාම ආදර්ශයක් විදිහට කුලියාපිටිය , බිංගිරිය, වාරියපොල අපි අවට තියෙන්නෙ.ඒ හැම සභාවකින්ම අපේ ප්‍රතිපාදන වලින් වැඩක් කරද්දි විපක්ෂය, ආණ්ඩුපක්ෂයෙ සියළු දෙනා සහභාගි කරගන්නවා.එතකොට අපි සියල්ලන්ගෙන්ම උදාහරණයක් විදිහට දෝතැල්ල කොට්ඨාශෙ ගත්තොත් ඒ කොට්ඨාශෙ මාර්ගවල සංවර්ධනයක් කරනකොට ඒ මන්ත්‍රීවරිය සහ අපි මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා. මේ තුන්දෙනාම සහභාගිවෙලා කරන වැඩකදි අපි දකින්නෙ නෑ.එතන වැරැද්දක් සිදු වුනාද කියලා ඇයි එතන අපි තුන්දෙනාම සහභාගි වෙලා.ඒ නිසා මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අප සභාවෙ යම් කිසි වැඩකදි අද සිට ඔබතුමාට ඒක අවස්ථාවක් ගන්න පුළුවන්නම් මේ සභාවට ප්‍රසාදයක් ලැබේවි.අපි සියළු මන්ත්‍රීවරු ඔය කොට්ඨාශවල වැඩක් කරද්දි සම්බන්ධ කර ගන්න.දැන් මගේ ප්‍රදේශයෙ මඩඉන වසමෙ මගෙ ගේ පිටිපස්සෙ පාර කැපුවා ඇත්තටම මම දන්නෙත් නෑ.අපිට කතා කලෙත් නෑ.අපිට කතා නොකර අපිට එතෙන්ට යන්ඩත් බැහැ.අපි කකුළෙන් අදින්නෙ නෑ.ඒ කරපු වැඩේ හොද වැඩක් මගෙ ගම් ප්‍රදේශයෙ පාරක් කැපුවෙ.අපි මෙතෙන්ට නියෝජිතයො වශයෙන් පත් කරල මෙතෙන්ට එව්වෙ අපේ ප්‍රදේශයේ අපි අතින් යම් කිසි වැඩක් වෙනවා දකින්න.ඒ ආදර්ශය අරගෙන අපි සියළුදෙනාගේ සහභාගිත්වයෙන් පක්ෂ, විපක්ෂ නැතිව සහයෝගයෙන් මේ සභාවෙ වැඩ ටික කරමුයි කියලා මා නවතිනවා.ස්තුතියි.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

බොහොම ස්තුතියි.මේක මන්ත්‍රීතුමා දෙන්න පුළුවන් අවස්ථාවක් නෙමෙයි.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. අශෝක මාපා හේරත් පෙ.ව.11.32 ට පමණ ගරු සභාවට පැමිණියා

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි.උපසභාපතිතුමනි, ගරු මන්ත්‍රීමන්ඩලයෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මන්ඩලයෙන් අවසරයි.මාධ්‍යවේදී සහෝදරියගෙන් අවසරයි.මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මං හිතනවා අපි නවක මන්ත්‍රීවරයෙක් හැටියට මංජුල සර් කිව්වොත් නිවැරදියි.අද අපේ ප්‍රාදේශීය සභාවට

නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් බන්ඩාරකොස්වත්ත මන්ත්‍රීතුමාගෙ අයින්වීමත් සමඟ ඒ වෙනුවට ආපු නවක මන්ත්‍රීවරයාට සමඟි ජන බලවේගය ඇතුළු විපක්ෂෙ සියළු දෙනාගෙ සතුට ඔබතුමාට ප්‍රකාශ කරනවා නවක මන්ත්‍රීවරයෙක් විදිහට මේ අවස්ථාවට සම්ප්‍රාප්ත වීම පිලිබඳ. ඇත්තටම ගරු සභාපතිතුමනි මං හිතුවා විදුහල්පති කෙනෙක් හැටියට සර් කෙනෙක් හැටියට ලස්සන කථාවක් අද මේ සභා ගර්භයේ තියෙයි කියලා.හැබැයි මං හිතනවා ගරු නවක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාවෙදි ඔබතුමා මොනවා හිතාගෙන කථා කරාද මට පුංචි සැකයක් හිතුනා.මං ඒකයි උපසභාපතිතුමාගෙ පැත්තට හැරිලා කිව්වෙ ගුරුවරයෙක් හැටියට ලස්සන කථාවක් කරා නම් කොච්චර වටිනවද? මේ සභාවෙ කියලා.ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට සුභපතනවා මම.ඔබතුමා ගුරු වෘතිය වගේම දේශපාලන වෘතියට ඔබතුමා ගමේ දේශපාලනය කරපු හොඳ චරිතයක් බව අපි දන්නවා.නමුත් මේ සභා ගර්භය තුලට ඇවිල්ලා අපි යම් යම් අධ්‍යානයන් කරන්න ඕන.ඒ නිසා ඔබතුමාගෙන් මම බොහොම නිහතමානීව ඉල්ලනවා අපි කරුණු කාරණා දැනගෙන හරියට කතා කලොත් මේ ඉදිරි ගමන යන්න පුළුවන්. මං දීර්සව කතා කරන්න යන්නෙ නෑ.සභාපතිතුමාට මං ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව දීම සම්බන්ධව.ස්තුති කරනවා වගේම දීපිකා රත්නායක මන්ත්‍රීතුමිය කිව්ව විදිහට සභාපතිතුමනි ඔබ තුමාට ස්තුතිය පුද කරන්න ඕන පහුගිය වකවානුවේ දවස් තුන හතරකට කලියෙන් අපේ ගේ වටේට මෝටර් ග්‍රේඩරය දාලා සංචාරයක් කලා.නමුත් සුනන්දපුර කොට්ඨාශෙ ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරයා හැටියට මං සතුටු වෙනවා .ඔබතුමාට මං ස්තුති කරන්නෙ ඒකයි.පහුගිය වකවානුවලදි සභාපතිවරු ඉද්දි අපි එදත් විපක්ෂෙ හිටියෙ සභාපතිවරයා ආණ්ඩුපක්ෂෙ හිටියත් හැබැයි ඔහු අපේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා අපිටත් යම් අවස්ථා ලබා දුන්නා.මොනයම් ගැටළු තිබ්බත්.හැබැයි මං අද සතුටු වෙන්නෙ ඔබතුමාට ස්තුති කලේ එදා අපිට ඒ අවස්ථාව දෙන කොට අපි ඒ මෝටර්ග්‍රේඩය පිටිපස්සෙ ගිහිල්ලා, වීදි ලාම්පු හදන්න ආවානම් ඒවා පස්සෙ ගිහිල්ලා අපේ කාලෙ,ශ්‍රමය මිඩංගු කරලා කටයුතු කලා.අද ඒ දේවල්කිසිදු දැනුම් දිමකින් තොරව ගමේ ඔබතුමාලගෙ දේශපාලනය කරපු අය හරහා කරනවා. කිසි ගැටළුවක් නෑ. කරන්න ඕන. සංවර්ධනය කරන්න ඕන. ජනතාවට වැඩ කරන්න ඕන. ඔබතුමාගෙ ආණ්ඩුපක්ෂෙ නියෝජිතයො දාලා කරගත්තට කිසි ප්‍රශ්නයක් නෑ.අද මං සතුටු වෙනවා එහෙම අපිට දැනුවත් නොකිරීම පිලිබඳව.මං යම් ආර්ථික තත්වයකින් ඉහලට ආවා.ඒ මොකද මං එහෙම කියන්නෙ. පහුගිය සභාපතිවරු අපිට ඒ,ඒ අවස්ථා දෙනකොට අපි ඒ පස්සෙ ගිහිල්ලා කාලය මිඩංගු කරා.ශ්‍රමය මිඩංගු කරා.හැබැයි ඔබතුමා අද අපිට ජනතාව මන්ත්‍රීවරු බවට පත් කරත් ඔබතුමා අපිව ගෙවල් වලට කොටු කරලා තියනවා.ඒ නිසා ඔබතුමා දන්නවා මං ගොවිතැන් බත් කරන මිනිහෙක්.අද බොහොම ලස්සන, සැහැල්ලුවෙන් ගොවිතැන් බත් කරගෙන සුමානෙ සෙනසුරාදාට පොලට ගිහිල්ලා රු.150,000.00ක් 160,000.00 ක මුදලක් උපයා ගන්න පුද්ගලයෙක් බවට පත්වෙලා තියෙනවා.මං සතුටුවෙන්නෙ සභාපතිතුමා හැටියට ඔබතුමා ඒ කරපු කාර්යයට.මන්ත්‍රීවරයෙක් හැටියට නෙමේ. ජනතාව දන්නවා මහජනයාගේ ඡන්දයෙන් පත්වුනේ කව්ද කියලා.හැබැයි ඔබතුමා දකිනවනම් අපිට ගෙදරට කොටු කරලා තියලා ඉදිරි මැතිවරණයක් ආපුවාම ඒකෙ ප්‍රතිඵලය සතුටු සාමයෙන් භුක්ති විදින්න බලාපොරොත්තු වෙනවානම් 22 තියෙනවා සමුපකාර ඡන්දය.ඔබතුමාට බලන්න පුළුවන් සුනන්දපුර කොට්ඨාශෙ මෝටර්ග්‍රේඩර් නෙමේ, විදී ලාම්පු නෙමේ මොනවා කරත් ජයග්‍රහණය කරන්නෙ කව්ද කියලා බලන්න පුළුවන් ඔබතුමාට.අභියෝග බාරගන්න අපි ඕන වෙලාවක ලෑස්තියි.ඔබතුමාගෙන් මං හැම තිස්සෙම ඉල්ලුවෙ මේ මන්ත්‍රීවරුන්ගෙ අනන්‍යතාවය රකින්න කියලා. මේ අයවැය පරාද වෙන්න පුළුවන්හ හැබැයි ඊළඟ අයවැයේදී ඔබතුමාලාත් එක්කලා කටයුතු කරන්න ඔබතුමා මේ මන්ත්‍රීවරුන්ගෙ හිත් දිනාගෙන කටයුතු කරන්න.හැබැයි ඔබතුමාගෙ අපිට පේන්නෙ නෑ මේ මන්ත්‍රීවරුන් 38 දෙනාගෙම හිත් දිනාගෙන කටයුතු කරන වග. මං ඔබතුමාගෙන් නිහතමානීව ඉල්ලනවා.ඔබතුමා ඊළඟ අවුරුද්දෙවත් අයවැය සම්මත කරගන්න.ඡන්දය දිනාගන්න කටයුතු කරන්න.අපි මේ විවේචනය කරන එක අඩු කරගන්න.අඩුකරගන්න පුළුවන් ඔබතුමාට.ඔබතුමා බොහොම නිහතමානීව, නම්‍යශිලීබවට පත් වුනොත්. වරදවා තේරුම් ගන්න එපා ගරු සභාපතිතුමනි.ඔබතුමා මේක තේරුම් ගන්නෙ නැති එක තමා ප්‍රශ්නෙ.යමක් කියපුවාම තමන්ගෙ තියන තත්වය පෙන්වන්නෙ නැතිව යම් නිහතමානීතත්වයක් පෙන්නලා මන්ත්‍රීවරුන්ගෙ හිත දිනාගෙන කටයුතු කරන්න.දියීවා සුළි කුනාටුවෙන් පාරවල් ආවනෙ. ඔබතුමාට තිබුනා මේ ඉන්න මන්ත්‍රීවරුන්ටත්

පාරක් දෙකක් දිලා කටයුතු කලා නම් අද මේක හොද ලස්සන සහා ගර්භයක් ලෙස ගෞරාන්විතව කටයුතු කරන්න පුළුවන් බවට පත්වෙනවා.මම ඔබතුමාගෙන් නැවත ඉල්ලන්නෙ මේ මන්ත්‍රිවරයන්ගෙ ගරුත්වය ආරක්ෂා කරමින් සභාපතිවරයෙක් විදිහට කටයුතු කරන්න කියන බොහොම නිහතමානී ඉල්ලීම කරමින් ඔබතුමා මේ අවස්ථාව ලබා දීම පිලිබඳව නැවතත් ස්තුතිවන්ත වෙමින් මං නිහඩ වෙනවා.

**(ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**(ඊ). I. 2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා 01.14 මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 අංක යටතේ දියීවා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් අදාල ප්‍රතිපාදන මුදල් ගෙවීමට අනුමැතිය ලබා ගැනීම කියන ශීර්ෂය හැර අනිත් ඒවා අනුමත කරන්න පුළුවන්.ඒකෙ සියළුම කරුනු කාරනා විස්තර සඳහන් වෙලා නැති හින්දා ඒක අනුමත කරන්න බැහැ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගාර මහතා**

ඒක සංශෝධනය කරනවා.මේ කමිටු වාර්තා මන්ත්‍රිතුමිය අනුමත කිරීමක් නෙමේ තියෙන්නෙ. සලකා බැලීමට විතරයි ඉදිරිපත් කරන්නෙ.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 වෙනි කරුණු සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරනවා.

**ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)**

2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 වෙනි කරුණු සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 වෙනි කරුණු සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරනවා.

**ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)**

2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 වෙනි කරුණු සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරනවා.

**ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

2026.01.14 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාවේ 36 වෙනි කරුණු සම්බන්ධයෙන් දැඩි විරෝධය පළ කරනවා

**(ඊ). II. 2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). III. 2026.01.22 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). IV. 2025 දෙසැම්බර් මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

.

**(උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**(උ) I. 2025 දෙසැම්බර් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

| | පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-14 |
|---|---|---|---|---|---|---|---|---|
| | මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2025 දෙසැම්බර් | | | | | | | |
| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
| 1 | වැටුප් හා දීමනා | 3176274.95 | 1152583.14 | 1828390.29 | 88978.78 | 394572.04 | 4425673.60 | 11066472.80 |
| 2 | ගමන් වියදම් | 55140.00 | 0.00 | 0.00 | 0.00 | 58694.00 | 0.00 | 113834.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 921917.53 | 1926161.64 | 267603.50 | 1470.00 | 0.00 | 107620.00 | 3224772.67 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 695168.29 | 767941.00 | 844072.00 | 22500.00 | 1144750.00 | 27390.00 | 3501821.29 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 1059671.28 | 427404.95 | 0.00 | 21503.36 | 69346.53 | 26314.77 | 1604240.89 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 277025.00 | 0.00 | 0.00 | 0.00 | 1498001.04 | 1775026.04 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 5499.95 | 0.00 | 0.00 | 0.00 | 3599.98 | 9099.93 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **5908172.05** | **4556615.68** | **2940065.79** | **134452.14** | **1667362.57** | **6088599.39** | **21295267.62** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 92900.00 | 116400.00 | 6970465.89 | 92000.00 | 0.00 | 920318.50 | 8192084.39 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **92900.00** | **116400.00** | **6970465.89** | **92000.00** | **0.00** | **920318.50** | **8192084.39** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතු** | **6001072.05** | **4673015.68** | **9910531.68** | **226452.14** | **1667362.57** | **7008917.89** | **29487352.01** |
| | තැන්පත් | 2539768.08 | | | | | | 2539768.08 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 1450177.48 | | | | | | 1450177.48 |
| | අත්තිකාරම් | 123000.00 | | | | | | 123000.00 |
| | ණයහිමි | 0.00 | | | | | | 0.00 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **4112945.56** | | | | | | **33600297.57** |

**(උ) II. 2025 දෙසැම්බර් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

| පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-16 |
|---|---|---|---|---|---|---|---|
| **මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2025 දෙසැම්බර්** | | | | | | | |
| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | [illegible] සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 37893.00 | 20800.00 | - | - | - | 4000.00 | 62693.00 |
| 20 කුලී | - | - | 1233707.80 | - | 969620.00 | 99350.00 | 2302677.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 40000.00 | - | - | - | 0.00 | 40000.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 222000.00 | 1058605.00 | 101530.00 | 1000.00 | - | 12690.00 | 1395825.00 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 22452.20 | 0.00 | 11061.00 | 4905.07 | 38418.27 |
| 60 වෙනත් ආදායම් | 117670.41 | 137140.00 | 0.00 | 131857.00 | 271646.54 | 895.00 | 659208.95 |
| 70වෙනත් ආධාර | 4470459.74 | 1232365.44 | 2856665.03 | 97467.20 | 207683.20 | 7705836.83 | 16570477.44 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4848023.15** | **2488910.44** | **4214355.03** | **230324.20** | **1460010.74** | **7827676.90** | **21069300.46** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 24655465.89 | 0.00 | 0.00 | 0.00 | 24655465.89 |
| **පුනරාවර්තන ආදායම් හා** | | | | | | | |
| **ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **4848023.15** | **2488910.44** | **28869820.92** | **230324.20** | **1460010.74** | **7827676.90** | **45724766.35** |
| තැන්පත් | 1638446.58 | | | | | | 1638446.58 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 35540.00 | | | | | | 35540.00 |
| සේවක ණය | 1513572.00 | | | | | | 1513572.00 |
| අත්තිකාරම් | 152500.00 | | | | | | 152500.00 |
| ණය ගැති | 0.00 | | | | | | 0.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 64915.00 | | | | | | 64915.00 |
| සේවක ඇප ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| **මුළු එකතුව** | **3404973.58** | | | | | | **49129739.93** |

**(උ) I11. 2025 දෙසැම්බර් මස ප්‍රා.ස.07 (ෂිෆ ආදායම් වාර්තාව) සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න

| පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | ප්‍රා.ස. 07 වාර්තාව - 2025 වර්ෂය | | | | මාසය:- දෙසැම්බර් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය 1 | මාසය මුලදී ඉදිරියට ලැබීම් 2 | මාසය තුළ බිල් කිරීම් 3 | ලැබිය යුතු මුළු ආදායම 4 | මාසය තුළ ලද ආදායම 5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම 6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම 7 | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම 8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය 9 | ඉදිරියට ගෙන යන හිඟය 10 | ඉදිරියට ලැබීම් 11 |
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6)+8 | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 21,093.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 16,800.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 224,300.00 | 41,902.20 | 1,068,400.00 | 1,292,700.00 | 1,089,447.80 | 41,902.20 | 0.00 | 2,000.00 | 0.00 | 163,350.00 | 2,000.00 |
| 4 | වත්කම් බදු 5/23 | 106,480.00 | 0.00 | 0.00 | 106,480.00 | 106,480.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 58,394.00 | 14,280.00 | 45,455.00 | 103,849.00 | 106,552.00 | 5,179.00 | 9,101.00 | 7,882.00 | 0.00 | 0.00 | 16,983.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16/ii | 0.00 | 0.00 | 16,800.00 | 16,800.00 | 16,800.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/16/1 | 0.00 | 0.00 | 4,000.00 | 4,000.00 | 4,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු 2/16/3 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 40,000.00 | 40,000.00 | 40,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **389,174.00** | **56,182.20** | **1,174,655.00** | **1,563,829.00** | **1,401,172.80** | **47,081.20** | **9,101.00** | **9,882.00** | **0.00** | **163,350.00** | **18,983.00** |

**(උ) IV. 2026 පෙබරවාරි මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

**මාසය :- 2026 පෙබරවාරි**

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2025 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2025 දෙසැම්බර් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9 (7+8) |
| 1 | වරිපණම් ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 2,500,000.00 | 800,000.00 | 3,300,000.00 | 1,592,032.54 | 21,093.00 | 1,613,125.54 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 2,000.00 | 1,000.00 | 3,000.00 | 21,578.00 | 16,800.00 | 38,378.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 2,500.00 | 2,500.00 | 5,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 5,000.00 | 5,000.00 | 10,000.00 | 87,000.00 | 4,000.00 | 91,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x) | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 9,000.00 | 0.00 | 9,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 600,000.00 | 250,000.00 | 850,000.00 | 1,761,600.00 | 16,800.00 | 1,778,400.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 400,000.00 | 200,000.00 | 600,000.00 | 1,433,492.66 | 40,000.00 | 1,473,492.66 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 0.00 | 0.00 | 0.00 | 315,600.00 | 0.00 | 315,600.00 |
| 9 | කඩ කුලී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 1,016,000.00 | 1,016,000.00 | 2,032,000.00 | 11,045,065.00 | 1,089,447.80 | 12,134,512.80 |
| 10 | ජංගම අලෙවි කුටි ( 3/22-i) | 303,600.00 | 0.00 | 303,600.00 | 25,300.00 | 25,300.00 | 50,600.00 | 303,600.00 | 0.00 | 303,600.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22-ii) | 720,000.00 | 0.00 | 720,000.00 | 60,000.00 | 60,000.00 | 120,000.00 | 12,000.00 | 0.00 | 12,000.00 |
| 12 | රථගාල් ගාස්තු(5/25/1-i) | 1,300,000.00 | 0.00 | 1,300,000.00 | 125,000.00 | 125,000.00 | 250,000.00 | 183,600.00 | 1,200.00 | 184,800.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 52,917.00 | 52,917.00 | 105,834.00 | 611,344.00 | 106,552.00 | 717,896.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/iV | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 950,000.00 | 955,000.00 | 1,905,000.00 | 10,129,880.00 | 667,950.00 | 10,797,830.00 |
| 15 | බදු කුලී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 420,000.00 | 1,958,000.00 | 2,378,000.00 | 9,511,515.70 | 106,480.00 | 9,617,995.70 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ5/2 | 50,000.00 | 0.00 | 50,000.00 | 10,000.00 | 0.00 | 10,000.00 | 31,000.00 | 20,000.00 | 51,000.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 62,500.00 | 62,500.00 | 125,000.00 | 345,500.00 | 0.00 | 345,500.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/)(1/ | 100,000.00 | 0.00 | 100,000.00 | 12,000.00 | 8,000.00 | 20,000.00 | 991,950.00 | 99,350.00 | 1,091,300.00 |
| | එකතුව | **55,538,600.00** | **0.00** | **55,538,600.00** | **6,246,217.00** | **5,521,217.00** | **11,767,434.00** | **38,385,757.90** | **2,189,672.80** | **40,575,430.70** |

**(උ) V.  2025 දෙසැම්බර් මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

| අනු අංක | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 140,765,086.00 | (840,000.00) | 139,925,086.00 | 93,647,386.00 | 11,705,900.00 | 105,353,286.00 | 106,215,131.93 | 11,066,472.80 | 117,281,604.73 | (11,928,318.73) |
| 2 | ගමන් වියදම් | 1,195,000.00 | 100,000.00 | 1,295,000.00 | 690,000.00 | 100,000.00 | 790,000.00 | 600,708.90 | 113,834.00 | 714,542.90 | 75,457.10 |
| 3 | සැපයුම් හා උපකරණ | 23,731,000.00 | 1,955,000.00 | 25,686,000.00 | 14,631,000.00 | 2,300,000.00 | 16,931,000.00 | 13,241,974.64 | 3,224,772.67 | 16,466,747.31 | 464,252.69 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 32,491,000.00 | 12,154,750.00 | 44,645,750.00 | 16,691,000.00 | 3,700,000.00 | 20,391,000.00 | 9,921,186.06 | 3,501,821.29 | 13,423,007.35 | 6,967,992.65 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11,924,000.00 | (1,561,500.00) | 10,362,500.00 | 6,800,000.00 | 1,500,000.00 | 8,300,000.00 | 4,189,571.36 | 1,604,240.89 | 5,793,812.25 | 2,506,187.75 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | - | - | - | - | - | - | - | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,956,000.00 | 1,336,500.00 | 10,292,500.00 | 4,456,000.00 | 1,300,000.00 | 5,756,000.00 | 2,640,792.64 | 1,775,026.04 | 4,415,818.68 | 1,340,181.32 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 654,544.00 | - | 654,544.00 | 436,360.00 | 54,549.00 | 490,909.00 | 176,945.70 | 9,099.93 | 186,045.63 | 304,863.37 |
| 9 | උපකරණ වැය | 51,275,000.00 | 53,060,000.00 | 104,335,000.00 | 33,360,000.00 | 4,515,000.00 | 37,875,000.00 | 5,041,184.61 | 8,192,084.39 | 13,233,269.00 | 24,641,731.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | | - | - | - | | - | - | | - | - |
| | එකතුව | **270,991,630.00** | **66,204,750.00** | **337,196,380.00** | **170,711,746.00** | **25,175,449.00** | **195,887,195.00** | **123,505,125.17** | **29,487,352.01** | **171,514,847.85** | **24,372,347.15** |

Table title: <u>මාසික වියදම් පුරෝකථන වාර්තාව - දෙසැම්බර්</u>

**(උ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.11.50 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.02.10 දින පැවති පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.